# පාර්ලිමේන්තු වාර්තා

පුවත් හසුන | 29 වැනි කාණ්ඩය | නොවැම්බර් 2022



## 2023 වර්ෂය සඳහා වන අයවැය කථාව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි.

2023 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ සමාරම්භක කථාව (අයවැය කථාව) ජනාධිපති සහ මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් මේ මස 14 වැනිදා අපර භාග 1.30 ට පමණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.








සන්නිවේදන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව

# අන්තර්ගතය



## පුවත්


■ දැයේ දූ දරුවන්ට පාර්ලිමේන්තුවෙන් ළමා කෘතියක්

■ ශ්‍රී ලංකාවේ කොරියානු තානාපතිවරයා සහ කථානායකවරයා අතර හමුවක්...

■ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන සියලු වාර්තා මෘදු පිටපත් ලෙස ඉදිරිපත් කිරීමට පියවර...

■ ශ්‍රී ලංකාවේ ඕමාන නව තානාපතිවරයා කථානායකවරයා හමුවෙයි


## පාර්ලිමේන්තු විදු පියසෙන්


■ පාසැල් සිසුන් ඇතුළු තරුණ තරුණියෝ පන්සියයකට ආසන්න පිරිසක් අයවැය ඉදිරිපත් කිරීම නැරඹීමට පැමිණෙති.....

■පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පැමිණි පාසල් සිසුවියෝ ගරු කථානායකතුමා හමුවෙති...

■ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව යාපනය විශ්ව විද්‍යාලයට....

■කඩවත මධ්‍ය විද්‍යාලයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව එක් වෙයි

■ප්‍රථමවරට විද්‍යුත් ඡන්ද ක්‍රමයෙන් පත්වූ ශිෂ්‍ය පාර්ලි-මේන්තුව ඇහැලියගොඩ ජාතික පාසැලේදී රැස්වෙයි...

■පාර්ලිමේන්තුවේ කටයුතු හා ක්‍රියාපටිපාටි පිළිබඳ කථාන ප්‍රාදේශීය සභා සභිකයන් දැනුවත් කෙරේ....

■ගිරිඋල්ල අධ්‍යාපන කලාපයෙහි පාසැල් සියයකට පන්නල ජාතික පාසැලේදී පාර්ලිමේන්තු ක්‍රමවේදය


## කාරක සභා පුවත්


■දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2022 ජුනි 30 දින වන විට ලැබිය යුතු මුලු හිඟ බදු, දඩ හා පොලී මුදල රුපියල් බිලියන 773 ක් - කෝපා කමිටුවේදී හෙළි වෙයි.

■ඕමාන තානාපති කාර්යාල නිලධාරියා පිළිබඳ මීට පෙර තීරණයක් නොගැනීම පිළිබඳ කෝපා කමිටුව ප්‍රශ්න කරයි...

■මෙරට සියලු ප්‍රවාහන සේවාවන් එක් ඩිජිටල් තලයකට ගෙන ඒම හරහා මගී පහසුව ඇති කිරීම පිළිබඳ ජාතික සභා අනු කමිටුවේ අවධානය...

■නාන කාමර උපාංග ආනයනය තාවකාලිකව අත්හිටුවීමට අදාළ ගැසට් නිවේදනයට අනුමතිය ලබා දීම පාරිභෝගිකයාට කරන අසාධාරණයක් - රජයේ මුදල් කාරක සභාවේ අවධානයට...

■පළමු වසරේ සිට දරුවන් තුළ කථන ඉංග්‍රීසි භාවිතය ශක්තිමත් කිරීමටපියවර ගන්නවා...-අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා-

■ලබාගත් ණය සඳහා බැංකු පොලී අනුපාත ඉහළ දැමීම නිසා පීඩාවට පත්වූවන්ට සහන සැලසීමට බැංකුවලට උපදෙස් ලබා දී තිබෙනවා - මහබැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවේදී පවසයි

■යෝජිත දූෂණ විරෝධී පනත් කෙටුම්පතින් පාර්ලිමේන්තුවට වගකියන අල්ලස් හා දූෂණ පිළිබඳ නව ස්වාධීන කොමිෂන් සභාවක්

■ප්‍රමාද වී ඇති විශ්‍රාමික පාරිතෝෂිකය ලබා දීමට කටයුතු කරනවා -අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා-

■නව ස්ථාවර කාරක සභා ද්විත්වයක් ස්ථාපිත කිරීමට අදාළ ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට

■ලැබී ඇති අමාත්‍ය මණ්ඩලය අනුමතිය අනුව, සමෘද්ධි නිලධාරීන්ට හා ක්ෂේත්‍ර නිලධාරීන්ට ඡන්දය ඉල්ලීමේ අවස්ථාව ලබාදීම සඳහා වහාම නීතිමය තත්ත්වය සකසන්න ...

■අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගෙන් නිලධාරීන්ට උපදෙස්...

■ජල සම්පාදනයේදී පිරිවැයට සරිලන ලෙස ජල ගාස්තුව සංශෝධනය කරන්න ජාතික සභාවේ යෝජනා සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණයට විශේෂිත ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීම පිළිබඳ අවධානය ...


කවරයේ කතාව

පාර්ලිමේන්තු ඡායා ගැලරිය

# කවරයේ කතාව



# 2023 වර්ෂය සඳහා වන අයවැය කථාව ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරයි.

2023 වර්ෂය සඳහා වන විසර්ජන පනත් කෙටුම්පත දෙවැනිවර කියවීමේ සමාරම්භක කථාව (අයවැය කථාව) ජනාධිපති සහ මුදල් ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා විසින් මේ මස 14 වැනිදා අපර භාග 1.30 ට පමණ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

# පුවත්





# දැයේ දූ දරුවන්ට පාර්ලිමේන්තුවෙන් ළමා කෘතියක්

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් ප්‍රකාශිත "පුංචි දූපතේ කුරුලු කතන්දරය" ළමා කෘතිය කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමන් ඇතුළු සම්භාවනීය අමුත්තන් රැසකගේ ප්‍රධානත්වයෙන් මේ මස 27 වැනිදා කොළඹ මහජන පුස්තකාලයේ ළමා අංශයේදී එළි දැක්විණි.

අනාගත නායකත්වයට සූදානම් වන දැයේ දරුවන් තුළ නියෝජිත ප්‍රජාතන්ත්‍රවාදය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳව සරල බසින් රසවින්දනාත්මකව පැහැදිලි කෙරෙන මෙම ළමා කෘතිය සිංහල, දමිල සහ ඉංග්‍රීසි භාෂා ත්‍රිත්වයෙන්ම පළ කර ඇත.

මෙහිදී පාර්ලිමේන්තුවේ මහ ලේකම් ධම්මික දසනායක මහතා විසින් කෘතියේ මුල් පිටපත කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාට පිළිගැන්වීම සිදුවිය. අනතුරුව කථානායකවරයා විසින් මෙම අවස්ථාවට සහභාගී වූ දරු දැරියන් පිරිසකට මෙම කෘතිය ප්‍රදානය කරන ලදී.



අනතුරුව පාර්ලිමේන්තුවේ කාර්ය මණ්ඩල ප්‍රධානී සහ නියෝජ්‍ය මහ ලේකම් කුෂානි රෝහණදීර මහත්මිය සිංහල බසින්ද අධ්‍යක්ෂ (පරිපාලන) ජී.තච්චනරාණි මෙනෙවිය දමිල බසින් ද පැමිණ සිටි දරුවන්ට කෘතියේ අන්තර්ගත කතාව ඉදිරිපත් කිරීම සිදුවිය.

මෙහිදී අදහස් දක්වමින් කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මැතිතුමා පැවසුවේ




විභාග පමණක් ඉලක්ක කරගත් අධ්‍යාපනය වෙනුවට දරුවන්ට තම පරිසරය වටපිටාව හා දේශපාලනය පිළිබඳ මූලික අදහසක් රසවින්දනාත්මකව කුඩා කල සිටම ලබා දිය යුතු බවයි. ඒ අරමුණ සහිතව රචිත මෙම කෘතිය සඳහා දායකවූ සියලු දෙනාට සිය ස්තූතිය ද පළ කරන බව කථානායකවරයා සඳහන් කළේය.

සම්මානිත මහාචාර්ය ජේ.බී. දිසානායක මහතාගේ සංස්කරණ දායකත්වයෙන් සම්පාදිත මෙම ළමා කෘතිය ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුවේ සේවයේ නියුතු නිපුනි බලගමගේ, ඉෂාරා වික්‍රමසිංහ,රිෂ්මියා නුටාන්, එස්.ජේය ප්‍රකාශ්, මහේශ්වරන් පිරසාත් සහ පී. රුද්‍ර කුමාර් යන කර්තෘ මඩුල්ල විසින් රචනා කොට ඇත. එසේම සරසවි ප්‍රකාශනයක් වන මෙම කෘතිය මුද්‍රණය සඳහා මූල්‍ය අනුග්‍රහය දක්වා ඇත්තේ ජාතික ප්‍රජාතන්ත්‍රවාදී ආයතනය (NDI) විසිනි. මෙම අවස්ථාවට සමගාමීව දරුවන් සඳහා චිත්‍ර ඇඳීමේ වැඩසටහනක් ද පැවැත්විණි.

ශ්‍රී ලාංකේය ළමා පරපුර තුළ පාර්ලිමේන්තුව පිළිබඳ අවබෝධයක් ඇතිකරලීම වෙනුවෙන් මෙවන් සාහිත්‍යමය නිර්මාණයක් ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් මුද්‍රණයෙන් එළිදැක්වූයේ ඉතිහාසයේ ප්‍රථම වරටය.


පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා, කොළඹ මහනගර සභාවේ වැඩබලන නගරාධිපති ගරු අල් - හාජ් එම්.ටී.එම්.ඉක්බාල් මහතා, කොළඹ මහජන පුස්තකාලයේ ප්‍රධාන පුස්තකාලයාධිපති වරුණි ගගබඩආරච්චි මහත්මිය, ළමා අංශයේ පුස්තකාලයාධිපති එච්.වී.එසී.සදමාලි මහත්මිය ඇතුළු නිලධාරීහු පිරිසක්ද NDI ආයතනයේ නියෝජිතයන් වන තරංගා ගුණසිංහ, චාමනි ප්‍රේමතිලක යන මහත්මීහුද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

පාර්ලිමේන්තුවට පැමිණෙන සියලු ප්‍රාථමික පාසල්වල පුස්තකාල සඳහා මෙම ළමා කෘතිය ඇතුළු පොත් කට්ටලයක් පිරිනැමීමට පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව ඉදිරියේදී අපේක්ෂා කරන අතර ඒ සම්බන්ධව පහත දුරකථන අංකවලින් වැඩිදුර තොරතුරු ලබාගත හැකිය.
දු.අ - 0112777318/ 0779899085





# ශ්‍රී ලංකාවේ කොරියානු තානාපතිවරයා සහ කථානායකවරයා අතර හමුවක්...









ශ්‍රී ලංකාවේ කොරියානු තානාපති වුන්ජින් ජොන්ග් මහතා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස 17 වැනිදා පාර්ලිමේන්තුවේ දී හමුවිය.

කොරියාවේ සීමෝල් පදනමේ සභාපති ලී සොන්ග් මහතා සහ සීමෝල් පදනමේ ශ්‍රී ලංකා කාර්යාලයේ අධ්‍යක්ෂ චෝයි සුන්ග් මහතා ද මෙම සාකච්ඡාවට සහභාගී වූහ.

සීමෝල් පදනම මගින් ක්‍රියාත්මක කෘෂිකාර්මික නිෂ්පාදන වැඩි දියුණු කිරීම්, ග්‍රාමීය ජනතාව සවිබල ගැන්වීම යනාදී ප්‍රජා මූලික සංවර්ධන වැඩසටහන් පිළිබඳව සීමෝල් පදනමේ සභාපතිවරයා මෙහිදී කථානායකවරයා දැනුවත් කළේය.

ඒ අනුව, කෘෂිකාර්මික ඇතුළු අනෙකුත් ක්ෂේත්‍රවල සංවර්ධන අවස්ථා තුළින් දෙරට අතර ද්වීපාර්ශ්වික සබඳතා වැඩිදියුණු කරගත හැකි ආකාරය පිළිබඳව මෙහිදී පුළුල් ලෙස සාකච්ඡා විය.

රාජ්‍ය අමාත්‍ය කනක හේරත් මහතාද මෙම අවස්ථාවට එක්ව සිටියේය.

# පාර්ලිමේන්තුවට ඉදිරිපත් කෙරෙන සියලු වාර්තා මෘදු පිටපත් ලෙස ඉදිරිපත් කිරීමට පියවර...



පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තා සහ කාර්ය සාධන වාර්තා මේ වනවිට මෘදු පිටපත් මාර්ගයෙන් පමණක් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලබන අතර එම වාර්තාවල සීමිත දෘඩ පිටපත් සංඛ්‍යාවක් පමණක් අවශ්‍යතාවය සැලකිල්ලට ගෙන මන්ත්‍රීවරයන්ගේ ප්‍රයෝජනය සඳහා සභා ගර්භයේ සහ පුස්තකාලයේ  තැබීමට කටයුතු කරනු ලබන බව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස 21 වැනිදා පාර්ලිමේන්තුවට නිවේදනය කළේය.

කඩදාසි සඳහා වැයවන අධික පිරිවැය හේතුකොටගෙන පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන සියලු වාර්තා මෘදු පිටපත් (Soft Copies) වශයෙන් ඉදිරිපත් කිරීමට 2022.06.02 දින පවත්වන ලද පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී තීරණය කෙරිණි.

ඒ අනුව, 2023 වර්ෂයේ විසර්ජන පනත් කෙටුම්පතට අදාළ කාරක සභා අවස්ථාවේ විවාදය පැවැත්වෙන කාල සීමාවේදී ඒ ඒ අමාත්‍යාංශ, දෙපාර්තමේන්තු සහ ව්‍යවස්ථාපිත ආයතන විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලබන ප්‍රගති වාර්තා ද මෘදු පිටපත් වශයෙන් මන්ත්‍රීවරයන් වෙත ලබා දීමට 2022.09.29 වන දින පැවති පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ දී තීරණය කළ බව ද කථානායකවරයා දැනුම් දුන්නේය. එම වාර්තාවල ද දෘඩ පිටපත් කිහිපයක් මන්ත්‍රීවරයන්ගේ ප්‍රයෝජනය සඳහා සභා ගර්භයේ සහ පුස්තකාලයේ තැබීමට කටයුතු කරන බව ද කථානායකවරයා පැවසීය.

# ශ්‍රී ලංකාවේ ඕමාන නව තානාපතිවරයා කථානායකවරයා හමුවෙයි.





ශ්‍රී ලංකාවේ ඕමාන නව තානාපති අහමඩ් අලි සයිද් අල් රෂ්දි මහතා මේ මස 25 වැනිදා පාර්ලිමේන්තුවේ දී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

දෙරට අතර පවතින ද්විපාර්ශ්වීය සබඳතා තවදුරටත් ශක්තිමත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳ අදහස් දැක්වූ තානාපතිවරයා, ශ්‍රී ලංකා - ඕමාන් පාර්ලිමේන්තු මිත්‍රත්ව සංගමය ප්‍රතිස්ථාපනය කිරීමේ වැදගත්කම පිළිබඳව අවධානය යොමු කළේය.

අයෝජන ප්‍රවර්ධන අවස්ථා පිළිබඳ මෙහිදී සාකච්ඡා කළ අතර දෙරටේ ව්‍යාපාරික දූත පිරිසට සංචාරය කිරීමට කටයුතු සම්පාදනය කිරීම පිළිබඳව ද සාකච්ඡා පැවැත්විය.

ඕමානය ඇතුළු මැදපෙරදිග රටවල් ශ්‍රී ලංකාවට ලබාදෙන සහයෝගය අගය කළ කථානායකවරයා ඒ පිළිබඳ සිය ප්‍රසාදය තානාපතිවරයා වෙත පළ කළේය.



# පාර්ලිමේන්තු විදු පියසෙන්

## පාසැල් සිසුන් ඇතුළු තරුණ තරුණියෝ පන්සියයකට ආසන්න පිරිසක් අයවැය ඉදිරිපත් කිරීම නැරඹීමට පැමිණෙති.....

පාසල් සිසුන් ඇතුළු තරුණ තරුණියෝ පන්සියයකට ආසන්න පිරිසක් ජනාධිපති, මුදල් අමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මහතා ඉදිරිපත් කළ අයවැය කතාවට සවන් දීම සඳහා මේ මස 14 වැනිදා පාර්ලිමේන්තුවට පැමිණි බව වේත්‍රධාරී නරේන්ද්‍ර ප්‍රනාන්දු මහතා පැවසීය.

මෙලෙස අයවැය ඉදිරිපත් කිරීමේ අවස්ථාවකට පාසල් සිසුන් ඇතුළු තරුණ ප්‍රජාවකට අවස්ථාව ලබා දී ඇත්තේ පාර්ලිමේන්තු ඉතිහාසයේ පළමුවරට බව ද වේත්‍රධාරීවරයා සඳහන් කළේය.

බස්නාහිර පළාතේ පාසල් කිහිපයක ශිෂ්‍ය නායකයන් ඇතුළු ජ්‍යෙෂ්ඨ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ ද ජාතික තරුණ සේවා සභාවේ තරුණ පාර්ලිමේන්තුව නියෝජනය කරන තරුණ තරුණියයෝ සියයකට ආසන්න ප්‍රමාණයක් ද මේ අතර වූහ. මීට අමතරව යොවුන් සේනාංකය නියෝජනය කරමින් තරුණ පිරිසක් ද අයවැය විවාදය නැරඹීමට පැමිණ සිටියහ.

අයවැය විවාදය නැරඹීමෙන් අනතුරුව ඔවුහු පාර්ලිමේන්තුවේ නැරඹුම් චාරිකාවකට ද එක්වූහ.











# පාර්ලිමේන්තුව නැරඹීම සඳහා පැමිණි පාසල් සිසුවියෝ ගරු කථානායකතුමා හමුවෙති...

පාර්ලිමේන්තුව නැරඹීම සඳහා අද මේ මස 01 වැනිදා පැමිණි මාතර සුජාතා විද්‍යාලයේ සිසුවියන් පිරිසකට ගරු කථානායකතුමා හමුවීමේ අවස්ථාව හිමිවිය. එහිදී ගරු කථානායක මහින්ද යාපා අබේවර්ධන මහතා සමග සුහද පිළිසඳරකට සහභාගී වීමට සහ ගරු කථානායකතුමන් වෙතින් ප්‍රශ්න විමසීමටද මෙහි දී සිසුවියන්ට හැකිවිය.

පාර්ලිමේන්තු රැස්වීම් පැවැත්වෙන දිනවලදී ද පාර්ලිමේන්තුව නැරඹීමට සහ පාර්ලිමේන්තු විවාද නැරඹීමට පාසල් දරුවන් සඳහා අවස්ථාව ලබා දීමට පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ අනුමතිය පසුගියදා හිමිවිය. ඒ අනුව පාර්ලිමේන්තු සභාගර්භයේ ඇති මහජන ගැලරියේ සිට පාර්ලිමේන්තු විවාද සජීවීව නැරඹීමේ අවස්ථාව පාසල් දරුවන් වෙත හිමිවේ.

මේ අනුව, පාසල් බලධාරීන්ට තම අයදුම්පත් වේත්‍රධාරී වෙත ලිපියක් මගින්, ෆැක්ස් මගින් (0112777473/ 0112777335) හෝ www.parliament.lk වෙබ් අඩවිය ඔස්සේ මාර්ගගතව යොමු කළ හැකි ය.











# ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව යාපනය විශ්ව විද්‍යාලයට....

ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් විශ්ව විද්‍යාල සදහා ආරම්භ කරන ලද පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියා පටිපාටි පිළිබඳ කෙටි පාඨමාලාව යාපනය විශ්ව විද්‍යාලයේ විද්‍යාර්ථීන් වෙනුවෙන් ද ආරම්භ කිරීම පසුගියදා සිදුවිය.



මේ අනුව මේ මස 31 වැනිදා යාපනය විශ්ව විද්‍යාලයේ දී පාඨමාලාවේ සමාරම්භක අවස්ථාව පැවත්විණි. එහි දී යාපනය විශ්ව විද්‍යාලයේ උප කුලපති මහාචාර්ය එස්. ශ්‍රීසත්ගුණරාජා මහතා, මෙවැනි පාඨමාලාවක් සංවිධානය කිරීම පිළිබඳ පාර්ලිමේන්තුව වෙත සිය ස්තූතිය පිරිනැමූ අතර පාඨමාලාව හැදෑරීමේ වැදගත්කම සහ අවශ්‍යතාවය පිළිබඳ කෙටි දේශනයක් ද විද්‍යාර්ථීන් වෙත ඉදිරිපත් කළේය.
යාපනය විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍ර පීඨයේ මාධ්‍ය අධ්‍යයනාංශයේ විද්‍යාර්ථීන්ගේ අධ්‍යයනය සඳහා ආරම්භ කරන ලද මෙම පාඨමාලාව සඳහා සම්පත් දායකත්වය සපයනු ලබන්නේ පාර්ලිමේන්තු මහ ලේකම් කාර්යාලයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසිනි.



මේ අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව වෙනුවෙන් ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ වැඩබලන සන්නිවේදන අධ්‍යක්ෂ එච්.ඊ.ජනකාන්ත සිල්වා, පරිපාලන අධ්‍යක්ෂ ජී. තච්චනරාණි, මාධ්‍ය කළමණාකාරිනි නිම්මී හාතියල්දෙනිය යන මහත්ම මහත්මීහු මෙම සමාරම්භක අවස්ථාවට එක්ව සිටියහ.







මෙහිදී පිරිස ඇමතූ ශාස්ත්‍ර පීඨයේ පීඨාධිපති මහාචාර්ය කේ. සුදාගර් මහතා ඉල්ලා සිටියේ මෙම පාඨමාලාව සිය විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා අධ්‍යනාංශයේ විද්‍යාර්ථීන් වෙනුවෙන් ද පවත්වන ලෙසයි.



යාපනය විශ්ව විද්‍යාලයේ මාධ්‍ය අධ්‍යයනාංශයේ අංශාධිපති මහාචාර්ය එස්. රඝුරාම්, මාධ්‍ය අධ්‍යයනාංශයේ කථිකාචාර්යවරයන් වන පූන්කුලලී ශ්‍රීසංගීතනන්, අනුතර්ෂි ගබිලන්, ජූඩ් දිනේෂ් කොඩුතෝර් යන මහත්ම මහත්මීහු ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මෙම පාඨමාලාව මගින් ප්‍රජාතන්ත්‍රවාදය හා පාර්ලිමේන්තු ක්‍රමවේදය, පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය, පාර්ලිමේන්තු ක්‍රමයේ විකාශය, පාර්ලිමේන්තු කාරක සභා ක්‍රමය, පාර්ලිමේන්තුව හා මහජනතාව, මන්ත්‍රිවරයන් සඳහා වන චර්යාධර්ම, ස්ථාවර නියෝග, මහජන සේවා ක්‍රියාවලිය සඳහා සහසම්බන්ධ වීම, කාන්තා නියෝජනය, වැනි විෂය ක්ෂේත්‍රයන් පිළිබඳව විද්‍යාර්ථීන්ට අවබෝධය ලබා දීමට නියමිය. පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියා පටිපාටි පිළිබඳ කෙටි පාඨමාලාව සඳහා දේශනමාලා හතරක් ද පාර්ලිමේන්තු අධ්‍යයන චාරිකාවක් ද ඇතුළත් වේ. ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විශ්ව විද්‍යාලයක් හා එක්ව මෙවැනි ශාස්ත්‍රීය පාඨමාලාවක් ප්‍රථම වරට ආරම්භ කරන ලද්දේ කොළඹ විශ්ව විද්‍යාලයේ දේශපාලන විද්‍යා සහ රාජ්‍ය ප්‍රතිපත්ති අධ්‍යයනාංශයේ අවසන් වසර විද්‍යාර්ථීන්ගේ අධ්‍යයනය වෙනුවෙනි.
මෙම පාඨමාලාව සඳහා යාපනය විශ්ව විද්‍යාලය සහ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සම්බන්ධීකරණය කරනු ලබන්නේ පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසිනි.







# කඩවත මධ්‍ය විද්‍යාලයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව එක් වෙයි



කඩවත මධ්‍ය මහා විද්‍යාලයේ ශිෂ්‍ය පාර්ලිමේන්තුවේ මංගල රැස්වීම පසුගියදා විද්‍යාලීය ප්‍රධාන ශාලාවේදි පැවැත්විණි. ඒ, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩබලන) ජනකාන්ත සිල්වා මහතාගේ ප්‍රධානත්වයෙනි.

ප්‍රජාතන්ත්‍රවාදයේ වටිනාකම් පාසල් ශිෂ්‍ය ශිෂ්‍යාවන් වෙත සමීප කරවමින් අනාගත නායකත්වය සඳහා පාසල් දරුවන් තුළ උත්තේජනයක්  ඇති කිරීම මෙම වැඩසහනේ මූලික අරමුණ වන අතර, ඊට අවශ්‍ය මූලික මඟ පෙන්වීම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව මගින් සිදු කෙරිණි.

වැඩසටහනේ මුඛ්‍ය දේශනය සිදු කළ ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ අධ්‍යක්ෂ සන්නිවේදන (වැඩබලන) ජනකාන්ත සිල්වා මහතා අවධාරණය කළේ අනාගත නායකත්වය වෙනුවෙන් වර්තමානයේ දරුවන් තුළ පවතින කැපවීම ඉතා සාධනීය තත්ත්වයක් බවත්, ඒ වෙනුවෙන් දරුවන්ගේ සාමූහික කැපවීම හා නිර්මාණශීලිත්වය පැසසිය යුතු බවයි.









# ප්‍රථමවරට විද්‍යුත් ඡන්ද ක්‍රමයෙන් පත්වූ ශිෂ්‍ය පාර්ලිමේන්තුව ඇහැලියගොඩ ජාතික පාසලේ දී රැස්වෙයි...



ප්‍රථමවරට විද්‍යුත් ඡන්ද ක්‍රමයෙන් පත්වූ ශිෂ්‍ය පාර්ලිමේන්තුව මේ මස 04 වැනිදා ඇහැලියගොඩ ජාතික පාසැලේදී රැස්විණි. එයට සමගාමීව ප්‍රජාතන්ත්‍රවාදය, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ක්‍රියා පටිපාටිය සහ සම්ප්‍රදාය පිළිබඳව විශේෂ දැනුවත් කිරීමේ වැඩසටහනක් ද පාසලේ දී උත්කර්ෂවත් අයුරින් පැවැත්විණි.

මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තු සභිකයන් තෝරාපත් කර ගැනීමේ ඡන්ද විමසීම මීට පෙර දිනක දී ඇහැලියගොඩ ජාතික පාසලේ දී පැවැත්විණි.



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ මෙම මහජන සේවා දැනුවත් කිරීමේ වැඩසටහන පැවැත්වූයේ ඇහැලියගොඩ ජාතික පාසලේ, විදුහල්පතිනි ඩබ්.ජී. එම්.එච්. එම්. රාජගුරු මහත්මිය විසින් පාර්ලිමේන්තුවෙන් කළ විශේෂ ඉල්ලීමකට අනුවය.

මෙම දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක සේවා අධ්‍යක්ෂ සහ වැඩබලන සන්නිවේදන අධ්‍යක්ෂ ජනකාන්ත සිල්වා මහතා ඇතුළු පාර්ලිමේන්තුවේ නිලධාරීහු සම්පත් දායකත්වය ලබා දුන්හ.



ඇහැලියගොඩ ජාතික පාසලේ, විදුහල්පතිනි ඩබ්.ජී. එම්.එච්. එම්. රාජගුරු මහත්මිය, සහකාර විදුහල්පති නිහාල් රණවීර මහතා, එම විදුහලේ ශිෂ්‍ය පාර්ලිමේන්තු සම්බන්ධීකාරක ආචාර්ය දසුන් ගමගේ මහතා, තොරතුරු තාක්ෂණ ආචාරිනී තමාරා ජයසේන මහත්මිය ඇතුළු ආචාර්ය භවතුන් රැසක් ද මෙම අවස්ථාවට එක්ව සිටියහ.

මෙම ශිෂ්‍ය පාර්ලිමේන්තු සභිකයන්, ඇහැලියගොඩ ජාතික පාසලේ ශිෂ්‍යයන් කණ්ඩායමක් සමග ඉදිරියේදී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව නැරඹීමට ද නියමිතය.



පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව හා සම්බන්ධවීමෙන් ඔබේ පාසලේ ද ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව පිළිබඳ මෙවන් සුවිශේෂී මහජන සේවා වැඩසටහන් සංවිධානය කිරීමේ හැකියාව තිබේ.

# පාර්ලිමේන්තුවේ කටයුතු හා ක්‍රියාපටිපාටි පිළිබඳ කටාන ප්‍රාදේශීය සභා සභිකයන් දැනුවත් කෙරේ....



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සංවිධානය කළ පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රියාපටිපාටි පිළිබඳ කටාන ප්‍රාදේශීය සභා සභිකයන් දැනුවත් කිරීමේ වැඩසටහනක් පසුගිය දා කටාන ප්‍රාදේශීය සභාවේ දී පැවැත්විණි. ශ්‍රී ලංකාවේ දැනට බලාත්මක ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව , එහි න්‍යාය සහ සම්ප්‍රදාය, ස්ථාවර නියෝග, පාර්ලිමේන්තු ක්‍රමවේදය, සම්ප්‍රදාය සහ නීති සම්බන්ධයෙන් ප්‍රාදේශීය සභා සභිකයන් දැනුවත් කිරීම සඳහා මෙම වැඩසටහන පැවැත්වූයේ කටාන ප්‍රාදේශීය සභාවේ ගරු මන්ත්‍රී එන්. අසංග කමල්සිරි ද සිල්වා මහතා විසින් පාර්ලිමේන්තුවෙන් කළ විශේෂ ඉල්ලීමකට අනුවය.



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ සහකාර මහ ලේකම් ටිකිරි කේ. ජයතිලක මහතා සහ අධ්‍යක්ෂ ව්‍යවස්ථාදායක සේවා සහ වැඩබලන අධ්‍යක්ෂ සන්නිවේදන ජනකාන්ත සිල්වා මහතා ඇතුළු පාර්ලිමේන්තුවේ නිලධාරීන් රැසක් මෙම වැඩසටහන සඳහා සම්පත් දායකත්වයෙන් සම්බන්ධ වූහ. එසේම, කටාන ප්‍රාදේශීය සභාවේ ගරු සභාපති කේ. සිසිර ප්‍රනාන්දු, ගරු උප සභාපති ආර්. ඒ. චමින්ද රත්නායක මහතා යන මහත්වරුන් ඇතුළු ප්‍රාදේශීය සභා සභිකයන් සියලු දෙනා මෙම දැනුවත් කිරීමේ වැඩසටහනට සහභාගී වූහ.



මෙහිදී ප්‍රාදේශීය සභා සභිකයෝ සක්‍රියව දැනුවත් කිරීමේ වැඩසටහන සමග සම්බන්ධ වූ අතර, අතීතයේ සිට වර්තමානය දක්වා වූ දේශපාලන පරිණාමය සහ ලාංකීය දේශපාලනයේ ඓතිහාසික පරිණාමය තුළ වෙනස්විය යුතුව තිබූ හැරවුම් ලක්ෂයන් පිළිබඳව ද සම්පත් දායකයන්ගෙන් ප්‍රශ්න නගමින් සිය අදහස් ද පළ කළහ.
එමෙන්ම, එළඹෙන අයවැය සමයේ දී පාර්ලිමේන්තුව නැරඹීමට සහ පාර්ලිමේන්තුවේ අයවැය විවාදයන් සජීවීව නැරඹීමට ක්ෂේත්‍ර චාරිකාවක් සංවිධානය කිරීමට ද මෙහිදී එකඟතාවය හිමි විය.



# ගිරිඋල්ල අධ්‍යාපන කලාපයෙහි පාසල් සියයකට පන්නල ජාතික පාසලේදී පාර්ලිමේන්තු ක්‍රමවේදය පිළිබඳව වැඩසටහනක්...

ගිරිඋල්ල අධ්‍යාපන කලාපයෙහි පාසල් සියයක ආචාර්ය භවතුන් සහ ශිෂ්‍ය පාර්ලිමේන්තු නියෝජනය කරන සිසු සිසුවියන් පිරිසකට ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව සහ එහි ක්‍රමවේදය පිළිබඳව සුවිශේෂ මහජන සේවා වැඩසටහනක් පසුගියදා පන්නල ජාතික පාසලේ දී පැවැත්විණි.



ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ ව්‍යවස්ථාදායක ක්‍රියාවලිය පිළිබඳව සවිස්තරාත්මක දේශනයක් පාර්ලිමේන්තුවේ පරිපාලන අධ්‍යක්ෂ ජී.තච්චනරාණි මෙනවිය විසින් ද, පාර්ලිමේන්තුව සහ ප්‍රජාතන්ත්‍රවාදය මැයෙන් දේශනයක් ජ්‍යෙෂ්ඨ පාර්ලිමේන්තු පුස්තකාලයාධිපති සියාද් අහමඩ් මහතා විසින් ද ශිෂ්‍ය පාර්ලිමේන්තුවට ප්‍රවේශයක් නමින් විශ්ලේෂණාත්මක දෙසුමක් මහජන සේවා නිලධාරී දුමින්ද වික්‍රමසිංහ මහතා විසින් ද ඉදිරිපත් කරන ලදි.



මෙම වැඩසටහන සඳහා සහභාගී වූ සියලු පාසල් පුස්තකාල සඳහා පාර්ලිමේන්තුවෙන් තිළිණ ලබාදුන් අතර සංවිධානය සඳහා සහයෝගය දැක් වූ පන්නල ජාතික පාසලේ විදුහල්පති යූ.එල්.ඒ.රහීම් මැතිතුමන් වෙත ද විශේෂ තිළිණයක් පිරිනැමිණි.



මෙම වැඩසටහන ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ගිරිඋල්ල අධ්‍යාපන කලාපයේ සාර්ථකව පැවැත් වූ දෙවන වැඩසටහනයි.








# කාරක සභා පුවත්













# දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2022 ජුනි 30 දින වන විට ලැබිය යුතු මුලු හිඟ බදු, දඩ හා පොලී මුදල රුපියල් බිලියන 773 ක් - කෝපා කමිටුවේදී හෙළි වෙයි.

- රුපියල් බිලියන 10 ඉක්මවූ මුදලක් වැයකොට සකස් කළ RAMI පද්ධතිය තවමත් නිසි ක්‍රියාකාරී මට්ටමක නැහැ...
- 2022 ජුනි 30 වන විට රුපියල් බිලියන 2.4 වටිනා අගරු වූ චෙක් පත් 4831 ක්...




දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට 2022 ජුනි 30 දින වන විට ලැබිය යුතු මුලු හිඟ බදු, දඩ හා පොලී මුදල රුපියල් 773,957,856,618 බව (බිලියන 773) කෝපා කමිටුවේ දී අනාවරණය විය.

මේ අතර මෙම මුදලෙන් රුපියල් 201,400,855,198 ක් (බිලියන 201) කිසිදු නීතිමය ගැටලුවකින් තොරව අය කළ හැකි ආදායම් වශයෙන් හඳුනාගෙන ඇති බවත් රුපියල් 572,557,001,420 ක් (බිලියන 572) යම් යම් හේතු මත අය කිරීම් තාවකාලිකව අත්හිටවා ඇති මුදල් වශයෙන් හඳුනාගෙන ඇති බවත් මෙහි දී අනාවරණය වුණි.



එසේම RAMIS සහ Legacy යන පද්ධති දෙක යටතේම අයවිය යුතු මුලු හිඟ බදු මුදල් වශයෙන් මෙම මුදල හඳුනාගෙන ඇති බව ද මෙහිදී විගණකාධිපතිවරයා විසින් පෙන්වාදෙන ලද අතර මෙම හිඟ බදු මුදලින් අය කළ හැකි ආදායම ලෙස පවතින රුපියල් බිලියන 201 මුදල අය කර නොගැනීම පිළිබඳව මෙහිදී දීර්ඝ ලෙස සාකච්ඡා විය. මේ අනුව පැමිණ සිටි නිලධාරීන් පෙන්වා දුන්නේ මෙම මුදල් දැනටමත් කොටස් වශයෙන් අයකර ගැනීමට කටයුතු කොට ඇති බවයි.



මෙහිදී මෙම කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතා නිර්දේශ කළේ අය කළ හැකි ආදායම් වශයෙන් හඳුනාගෙන ඇති හිඟ බදු මුදල් කොටස් වශයෙන් හෝ අයකර ගන්නා ආකාරය පිළිබඳ දින වකවානු සහිතව තොරතුරු ඇතුළත් වාර්තාවක් කෝපා කමිටුවට ලබා දෙන ලෙසයි.

මේ පිළිබඳ අනාවරණය වුයේ දේශීය ආදායම් දෙපාර්තමේන්තුව 2021 මාර්තු 24 දින කෝපා කමිටුවට කැඳවා ලබාදුන් නියෝග ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කිරීමට සහ 2023 අයවැයෙන් යෝජනා කොට ඇති බදු ආදායම ලඟාකර ගැනීම සඳහා දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හැකියාව තිබේදැයි පරීක්ෂාකර බැලීම සඳහා රජයේ ගිණුම් පිළිබඳ

කාරක සභාව පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 28 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේදී ය.

මෙහි දී පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු කබීර් හෂීම් මහතා පෙන්වා දුනනේ 2022 වර්ෂයේ දී ඇස්තමේන්තු කළ බදු ආදායම ලෙස රුපියල් බිලියන 1852ක් රජය අපේක්ෂා කොට ඇති බවත් එය 2023 මෙවර අය වැයේ දී රුපියල් බිලියන 3130 දක්වා වැඩිකර ගැනීමට සැලසුම් කොට ඇති බවත් ය. එබැවින් මේ වන විටත් හිඟ බදු විශාල ප්‍රමාණයක් තිබිය දීත් 2023 අයවැයෙන් 69% වැඩිවීමක් ලබාගැනීමට දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට හැකියාව තිබේදැයි යන්න විශාල ගැටලුවක් බව ඒ මහතා මෙහිදී සඳහන් කළේය.

මෙම අපේක්ෂිත බදු ආදායම ළඟාකර ගැනීමට නොහැකි වුවහොත් විශාල අයවැය පරතරයක් ඇති වන බවත් රටක් ලෙස බලාපොරොත්තු වන සියලු ඉලක්ක සපුරාගැනීම අසාර්ථක වන බවත් හෙතෙම වැඩිදුරටත් පෙන්වා දුන්නේය. මෙහි දී මෙම බදු මුදල් අයකරගැනීම සඳහා ඇති ප්‍රධාන සාධකයක් ලෙස ආදායම් පරිපාලන කළමනාකරණ තොරතුරු පද්ධතිය (RAMIS) හඳුනාගෙන ඇති බව ද සභාපතිවරයා පෙන්වා දුන්නේය.

එසේම මෙම RAMIS පද්ධතිය සකස්කිරීම සඳහා රුපියල් බිලියන 10 ඉක්මවූ මුදලක් වැයකොට ඇති බව විගණකාධිපතිවරයා පෙන්වා දුන් අතර එසේ වුව ද නිසි ක්‍රියාකාරීමට්ටමක එය නොපවතින බව ද හෙතෙම පෙන්වා දුන්නේය. එසේම මින් පෙරද අවස්ථා කිහිපයක දීම මේ පිළිබඳ කෝපා කමිටුවේ දී පෙන්වා දුන්නද ඒ සම්බන්ධයෙන් තවමත් විධිමත් පියවරක් ගෙන නොමැති බව ද විගණකාධිපතිවරයා මෙහි දී සඳහන් කළේය.

තව ද මේ සම්බන්ධයෙන් වන ගිවිසුම සහ ඊට අදාළ මුදල් ගෙවීම් පිළිබඳ තොරතුරු දේශීය ආදායම් දෙපාර්තමේන්තුව විසින් තමාට ලබා නොදෙන බව ද විගණකාධිපතිවරයා සඳහන් කළේය. විශේෂයෙන්ම ගිවිසුම ප්‍රකාරව තමාට එම තොරතුරු ලබා දීමට නොහැකි බව දේශීය ආදායම් දෙපාර්තමේන්තුව පවසන බවත් එය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට පටහැනි කටුයුත්තක් බවත් මෙහිදී විගණකාධිපතිවරයා වැඩිදුරටත් පෙන්වා දුන්නේය.

මේ අනුව මෙම RAMIS පද්ධතිය පිළිබඳ ප්‍රසම්පාදනය ඇතුළු අංශ ගණනාවක් සම්බන්ධයෙන් ගැටලු කාරී තත්ත්වයන් පෙනීයන හෙයින් මෙම පද්ධතිය රටට ගැලපෙන ආකාරයෙන් ක්‍රියාකාරී මට්ටමට පත් කිරීම පිළිබඳ දින වකවානු සහිතව මාසයක් ඇතුළත වාර්තාවක් ලබාදීමට කෝපා කමිටුව නිර්දේශ කළේය. එසේම එම වාර්තාව ප්‍රමාණවත් නොවන්නේ නම් ගනු දෙනු පිළිබඳ විගණනයක් කිරීමට කටයුතු කරන බවද කාරක සභාවේ සභාපතිවරයා සඳහන් කළේය.

එසේම 2022 ජුනි 30 වන විට රුපියල් 2,488,003,615 (බිලියන 2.4) වටිනා අගරු වූ චෙක් පත් 4831 පැවතීම පිළිබඳව ද මෙහි දී අනාවරණය විය. මෙම අගරු චෙක්පත් අතරින් රුපියල් 1,429,356,750 ක් වටිනා චෙක්පත් 3817 ක් වසර 3කට වඩා පැරණි ඒවා බවද මෙහිදී අනාවරණය විය.

මේහි දී මේ සම්බන්ධයෙන් නීතිමය පියවර නොගැනීම පිළිබඳ කමිටුව ප්‍රශ්න කළ අතර නීතිමය පියවර ගැනීමට තම දෙපාර්තමේන්තුවට බලය නොමැති බව පැමිණ සිටි නිලධාරීහු සඳහන් කළේය. මෙය සාපරාධී අපරාධයක් බවත් මේ සම්බන්ධයෙන් අවශ්‍ය නීතිමය කටයුතු ඉක්මනින් ක්‍රියාත්මක කළ යුතු බවත් මෙහි දී කෝපා කමිටුවේ සභාපතිවරයා පෙන්වා දුන්නේය.

එසේම නීතිපති දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කොට මේ සම්බන්ධයෙන් නීතිමය පියවර ගැනීම පිළිබඳ මාසයක් ඇතුළත කෝපා කමිටුවට වාර්තාවක් ලබාදෙන ලෙස ද මෙහි දී කෝපා කමිටු සභාපතිවරයා නිර්දේශ කළේය.



# ඕමාන තානාපති කාර්යාල නිලධාරියා පිළිබඳ මීට පෙර තීරණයක් නොගැනීම පිළිබඳ කෝපා කමිටුව ප්‍රශ්න කරයි...

## ■ විදෙස් රැකියා සඳහා පවතින ඉල්ලුමට සරිලන පරිදි පුහුණු ශ්‍රමිකයන් නොමැති වීමේ ගැටලුව විසඳීම සඳහා කෝපා අනුකමිටුවක්....



මේ වන විට වැඩ තහනමකට ලක්ව සිටින ඕමාන තානාපති කාර්යාල නිලධාරියාට එරෙහිව පැමිණිලි මේ වසරේ පෙබරවාරි මාසයේ සිට ලැබී තිබුණ ද ඒ සඳහා තීරණයක් ගැනීම ප්‍රමාද වී ඇති බව මේ මස 22 වැනිදා පැවති රජයේ ගිණුම් කාරක සභාවේදී අනාවරණය විය.

අතිරේක විගණකාධිපති. පී.එල්.කේ පෙරේරා මහතා මෙහි දී පෙන්වා දුන්නේ 2022.02.28 වන දින විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු සභාපතිවරයා විසින් මෙම නිලධාරියා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කාර්යාලය හරහා පරීක්ෂණයක් කරන ලෙස ඉල්ලා ඇති බවයි. එසේම මෙම පුද්ගයා සම්බන්ධයෙන් මුදල් වංචා, සහතික වංචා ආදිය වාර්තා වී තිබූ බවද අතිරේක විගණකාධිපතිවරයා පැවසීය.



මේ අනුව මෙම පුද්ගලයා තනතුරේ රැදී සිටියහොත් පරීක්ෂණවලට බාධා විය හැකි බැවින් වහාම මෙරටට ගෙන්වීමට කටයුතු කරන ලෙස විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු සභාපති මේජර් ජනරාල් මහින්ද හතුරුසිංහ මහතා මෙම වසරේ පෙබරවාරි අමාත්‍යාංශයෙන් ඉල්ලීමක් ද කර ඇති බව මෙහි දී අනාවරණය විය. මාධ්‍ය ඔස්සේ මෙම සිදුවීමට විශාල ප්‍රචාරයක් ලැබෙන තුරු පිය-වර නොගැනීම සම්බන්ධයෙන් කමිටුව දැඩි අප්‍රසාදය මීට අදාළ නිලධාරීන්ට පළ කළ සිටියහ.

විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහි දී පවසා සිටියේ 2022.02.28 දින විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ හිටපු සභාපතිවරයාගේ ඉල්ලීමට අනුව මෙම නිලධාරියා සම්බන්ධයෙන් අභ්‍යන්තර විගණන කාර්යාලය හරහා පරීක්ෂණයක් සිදු කළ ද චෝදනා තහවුරු කිරීමට නොහැකි වූ බවයි. ඔමානයේ මෙරට තානාපතිවරයාගෙන් වාර්තාවක් කැඳවීමෙන් අනතුරුව සහ නොවැම්බර් 4 වැනිදා පොලිසියේ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවෙන් ලැබුණු පරීක්ෂණ වාර්තාව මත කාර්යාංශය මගින් නිලධාරියාගේ වැඩතහනමකට ලක් කළ බවත් අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහි දී පවසා සිටියේ ය.



මෙම නිලධාරියා සම්බන්ධයෙන් කඩිනමින්

පියවර නොගැනීම සම්බන්ධයෙන් කමිටුව දැඩි අප්‍රසාදය පළ කළ අතර ඒ සම්බන්ධයෙන් දීර්ඝ ලෙස ප්‍රශ්න කළේ ය.
මෙහිදී කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශයේ ලේකම්වරයා පැවසුවේ තමා මෙම අමාත්‍යාංශයට පැමිණියේ මෙම වසරේ මැයි මාසයෙන් පසුව වුවද වගකීම භාර ගන්නාබවයි.
මෙහිදී කමිටුව පෙන්වා දුන්නේ ලේකම්වරයා වෙනස් වුවද නිලධාරීහු මෙහි වගකීම දැරිය යුතු බවයි.
හෙදියන් ඇතුළු ක්ෂේත්‍ර ගණනාවක විදෙස් රැකියා සඳහා පවතින ඉල්ලුමට සරිලන පරිදි පුහුණු ශ්‍රමිකයන් නොමැති වීම පිළිබඳවද මෙහ දී දීර්ඝ ලෙස සාකච්ඡා විය. මෙහිදී කෝපා කමිටුව පෙන්වා දුන්නේ විදේශ සේවා නියුක්ති කාර්යාංශයේ වගකීම වන්නේ නුපුහුණු ශ්‍රමිකයන් විදෙස්ගත කිරීම නොව  අදාළ අනෙකුත් සියලු අමාත්‍යාංශ සහ ආයතන සමග ඒකාබද්ධ ප්‍රවේශයකින් කටයුතු කර විදෙස් රැකියා සඳහා ඉල්ලුමට සරිලන පරිදි පුහුණු ශ්‍රමිකයන් විදෙස්ගත කිරීම බවයි.



මේ අනුව කමිටු සභාපතිවරයා කම්කරු හා විදෙස් රැකියා අමාත්‍යාංශයේ ලේකම්වරයාට නියෝග කළේ විදේශ කටයුතු අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය ඇතුළු අනෙකුත් අදාළ සියලු ආයතන සමග මනා සම්බන්ධීකරණයෙන් විදෙස් රැකියාවල පවතින ඉල්ලුමට සරිලන පරිදි පුහුණු ශ්‍රමිකයන් යැවීම සඳහා වැඩපිළිවෙළක් මාස 2ක් තුළ සකස් කරන ලෙසයි. එසේම මේ සඳහා කෝපා කමිටුවේ අනු කමිටුවක්ද පත් කරන බව කෝපා සභාපති කබීර් හෂීම් මහතා පැවසීය.




## මෙරට සියලු ප්‍රවාහන සේවාවන් එක් ඩිජිටල් තලයකට ගෙන ඒම හරහා මගී පහසුව ඇති කිරීම පිළිබඳ ජාතික සභා අනු කමිටුවේ අවධානය...

දුම්රිය, බස් රථ, පාසල් වෑන් හා ටැක්සි සේවා ඇතුළු  මෙරට සියලු ප්‍රවාහන සේවාවන් එක් ඩිජිටල් තලයකට ගෙන ඒම හරහා මගී පහසුව ඇති කිරීම පිළිබඳ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කමිටුවේදී සාකච්ඡා විය.

මේ පිළිබඳ සාකච්ඡා වුයේ ආර්ථිකය ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන ජාතික සභා අනු කමිටුව එහි සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 21 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේ දී ය.

මෙම කාරක සභාව සඳහා මෙරට ප්‍රවාහන ක්ෂේත්‍රය හා සම්බන්ධ පාර්ශ්ව කිහිපයකම නියෝජිතයින් සහභාගී වූ අතර මේ වන විට ප්‍රවාහන ක්ෂේත්‍රයේ පවතින ගැටලු පිළිබඳ ඒ ඒ පාර්ශ්ව වල අදහස්

ලබාගැනීම සිදු විය.

මෙහිදී ශ්‍රී ලංකා පෞද්ගලික බස් රථ හිමියන්ගේ සංගමය, ත්‍රී රෝද රථ සංගමය, පාසල් ළමුන් ප්‍රවාහන සංගමය ඇතුළු ප්‍රවාහන සේවා නියෝජිතයින් පෙන්වා දුන්නේ ඉන්ධන මිල ඉහළ යාම, වාහන ආනයනයට පනවා ඇති සීමා සහ වාහන අමතර කොටස් සම්බන්ධයෙන් පනවා ඇති සීමා හේතුවෙන් ඔවුන්ට දැඩි අපහසුතාවන්ට මුහුණපෑමට සිදු වී ඇති බවයි. විශේෂයෙන්ම වාහන ටයර ඇතුළු අමතර කොටස් වල මිල 300% පමණ ඉහළ ගොස් ඇති බවද ඔවුහු පෙන්වා දුන්හ. එසේම වාහන අමතරකොටස් හිගය හේතුවෙන් බස් රථ, පාසල් වෑන් රථ සහ ත්‍රී රෝද රථ ඇතුළු ප්‍රවාහනය සඳහා භාවිත වන රථ වාහන අඩුවෙමින් පවතින බව ද මෙම නියෝජිතයෝ පෙන්වා දුන්හ.



මෙහි දී මෙම සියලු තත්වයන් පිළිබඳ අවධානය යොමු කරමින් යෝජනා කිහිපයක් කමිටුව විසින් ඉදිරිපත් කරන බව අනු කමිටු සභාපති පාඨලී චම්පික රණවක මහතා පැවසීය. ඒ අනුව වැදගත් යෝජනාවක් ලෙස මගී පහසුව ඇති කිරීම සඳහා මෙරට සියලු ප්‍රවාහන සේවාවන් එක් ඩිජිටල් තලයකට ගෙන ඒම යෝජනා කරන බව ඒ මහතා පැවසීය.



මේ අනුව මෙම සියලු යෝජනාවල එකතුවක් දෙසැම්බර් මස ජාතික සභාවට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වන බව ද සභාපතිවරයා වැඩිදුරටත් පැවසී ය.





# නාන කාමර උපාංග ආනයනය තාවකාලිකව අත්හිටුවීමට අදාළ ගැසට් නිවේදනයට අනුමතිය ලබා දීම පාරිභෝගිකයාට කරන අසාධාරණයක් - රජයේ මුදල් කාරක සභාවේ අවධානයට...

- දේශීය සෙරමික් භාණ්ඩ නිෂ්පාදනය සහ ඊට අදාළ ව්‍යාපාර ක්ෂේත්‍රය නියෝජනය කරන බාහිර පාර්ශ්වයන්ගේ අදහස් දැක්වීම ප්‍රථම වතාවට කමිටුව හමුවට..
- පසු ගිය වසර දෙක තුළ සහල්, බඩ ඉරිඟු ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය මෙරටට ගෙන ඒම සඳහා ප්‍රමාණයන් තීරණය කළ ආකාරය පිළිබඳ හේතු දක්වමින් වාර්තාවක් ඉදිරිපත් කිරීමට නිර්දේශ
- 2023 වර්ෂය සඳහා විසර්ජන පනත සාකච්ඡාවට...



1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි සඳහන් 2296/30 ගැසට් පත්‍රය සඳහා අනුමතිය ලබා දීමට ඒ පිළිබඳව තවදුරටත් විශ්ලේෂණාත්මක සාකච්ඡා වටයන් පැවැත්විය යුතු බවත්, මේ සඳහා අනුමතිය ලබා දීම මගින් පාරිභෝගිකයාට සාධාරණයක් සිදුවනවා ද යන්න පිළිබඳව සැලකිල්ලට බඳුන් කළ යුතු බවත් රජයේ මුදල් පිළිබද කාරක සභාවේ දී අවධානයට ලක් විය.

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 01 වැනිදා රැස් වූ රජයේ මුදල් පිළිබද කාරක සභාවේ දී මේ පිළිබඳව සාකච්ඡා කෙරිණි.



මෙම ගැසට් පත්‍රය මගින් උක්කුටික පෝච්චි (Squatting pans), සොරොව් බේසම් (sink), ඇතුළු නාන කාමර උපාංගයන් ආනයනය තාවකාලිකව අත්හිටවීමට අදාළව මෙම ගැසට් පත්‍රය ප්‍රකාශයට පත් කර තිබිණි. තව ද, එම ගැසට් පත්‍රය මගින්ම ටයිල් ආනයනය තහනම් කිරීම හරහා වෙළඳපොළ තුළ ඇතිව තිබෙන ඒකාධිකාරිය හා ආනයනය නවතා තිබෙන වාතාවරණයක් තුළ ටයිල් ඇතුළු නාන කාමර උපාංගයන්හී මිල පාරිභෝගිකයාට අසාධාරණයක් වන පරිදි ඉහළ යාම මෙන්ම ඉල්ලුමට අනුව සැපයුම නොමැති වීම පිළිබඳවද කමිටු සාමාජිකයන්ගේ අවධානයට ලක් විය. ඒ අනුව, මේ සම්බන්ධ වාර්තාවක් ඉදිරිපත් කිරීමට මුදල් අමාත්‍යංශයට කමිටුව විසින් නිර්දේශ කරන ලදි.



2298/55 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ සදහන් ආනයන හා අපනයන (පාලන) පනත

යටතේ රෙගුලාසි ද මෙහිදී සලකා බැලූන අතර ඊට අදාළ ගැසට් පත්‍රයට අනුමතිය ලබා දීම සිදුවිය. මෙම ගැසට් පත්‍රය මගින් විදෙස්ගත ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ වල වටිනාකම මත පදනම්ව ඔවුන්ට විද්‍යුත් මෝටර් වාහන ආනයන කිරීම සඳහා අවසර ලබා දීම සිදුවේ.

රජයේ මුදල් පිළිබඳ කාරක සභාව විසින් 2297/79 දරන අති විශේෂ ගැසට්පත්‍රයේ සදහන් ආනයන හා අපනයන (පාලන) පනත යටතේ රෙගුලාසි පිළිබඳව ද මෙහි දී සලකා බලන ලදී. මෙමගින් අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය විවෘත ගිණුම් ක්‍රමය යටතේ ආනයනය කිරීම සඳහා වූ කාලය දීර්ඝ කිරීම සිදුවේ.

මෙහි දී, පසු ගිය වසර දෙක තුළ සහල්, බඩ ඉරිඟු ඇතුළු අනෙකුත් ද්‍රව්‍ය මෙරටට ගෙන ඒම සඳහා ප්‍රමාණයන් තීරණය කළ අකාරය පිළිබඳව කමිටුවේ අවධානය යොමු විය.

තව ද ප්‍රමාණයට වඩා සහල් ගෙන්වා එය මිශ්‍ර කොට විකිණීම සම්බන්ධයෙන් කමිටු සාමාජිකයන් අවධානය යොමු කරන ලද අතර, සත්ත්ව අහාර නිෂ්පාදනය සඳහා අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය ගැටලුකාරී තත්ත්වයක් වන බැවින් බිත්තර සහ කුකුළු මස් කර්මාන්තය දැඩි අර්බුදයකට ලක්ව ඇති බවත්, ඒ හේතුවෙන් බිත්තර සහ කුකුළු මස් මිල ඉහළ යාම පිළිබඳව ද සාකච්ඡා විය.

මෙම තත්ත්වයන් පිළිබඳ විමසීමේ දී, ඒ හා සම්බන්ධ කිසිදු දත්තයන් මත පදනම් වූ තොරතුරු නොමැති වීම පිළිබඳව කමිටුව සිය නොසතුට පළ කළ අතර මේ සම්බන්ධයෙන් පැහැදිලි දත්ත ඇතුළත් වාර්තාවක් මාස 02ක කාලයක් තුළ කමිටුවට ඉදිරිපත් කරන ලෙස අදාළ බලධාරීන් හට නිර්දේශ කරන ලදී.

තව ද, 2023 වර්ෂය සඳහා විසර්ජන පනත් කෙටුම්පත රජයේ මුදල් කාරක සභාවේ දී සාකච්ඡා කරනු ලැබූ අතර මෙවර ඉදිරිපත් කරනු ලබන ඇස්තමේන්තු සම්බන්ධයෙන් මුදල් අමාත්‍යාංශය කෙතරම් සුභවාදී දැක්මකින් යුක්ත ද යන්න පිළිබඳව කමිටු සමාජිකයන් ප්‍රශ්න කළහ. මෙහිදී කමිටුව විසින් මෙවර අයවැය තුළ අඩු අදායම්ලාභීන් පිළිබඳව වැඩි අවධානයක් යොමු විය යුතු බවට සාකච්ඡා විය.

## පළමු වසරේ සිට දරුවන් තුළ කථන ඉංග්‍රීසි භාවිතය ශක්තිමත් කිරීමට පියවර ගන්නවා...

**-අධ්‍යාපන අමාත්‍ය සුසිල් ප්‍රේමජයන්ත මහතා-**



පළමු වසරේ සිට දරුවන් තුළ කථන ඉංග්‍රීසි භාවිතය ශක්තිමත් කිරීමට 2023 වසරේ සිට පියවර ගන්නා බව අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතා පැවසීය. ඒ අනුව සියලු පළාත් නියෝජනය වන පරිදි රජයේ පාසල් වල පළමු සහ දෙවැනි ශ්‍රේණි නියෝජනය කරන ගුරු භවතුන් ආසන්න වශයෙන් 13500 ක් එළඹෙන නොවැම්බර් 18 සහ 19 දෙදින තුළ පුහුණුකරුවන් ලෙස ජාතික අධ්‍යාපන ආයතනය විසින් පුහුණු කිරීමට සියලු කටයුතු සූදානම් කොට ඇති බව ද අමාත්‍යවරයා පැවසීය.

ඒ මහතා මේ අදහස් පළ කළේ අනාගත අවශ්‍යතාවන්ට ගැලපෙන අයුරින් පාසල් සිසුන්ට ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීම සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු වාසුදේව නානායක්කාර මහතා විසින් කරන ලද ඉල්ලීමකට ප්‍රතිචාර දක්වමිනි.

අධ්‍යාපන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය කාරක සභාව එහි සභාපති අධ්‍යාපන අමාත්‍ය ගරු සුසිල් ප්‍රේමජයන්ත මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 08 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස්විය.

ඉංග්‍රීසි මාධ්‍ය පාසල් පෙළ පොත්වල පවතින ව්‍යාකරණ දෝෂ පිළිබඳ මෙහි දී අවධානය

යොමු වූ අතර අමාත්‍යවරයා ජාතික අධ්‍යාපන ආයතනයට උපදෙස් ලබා දුන්නේ එසේ ව්‍යාකරණ දෝෂ පවතින්නේ ද යන්න සොයා බලන ලෙසයි.

එමෙන්ම ලංකාවේ දමිළ මාධ්‍ය පාසල්වල දරුවන්ට තමන් කැමතිනම් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීම සඳහා අවස්ථාව ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීම ද මෙහි දී සලකා බැලිණි. විශේෂයෙන් සිංහල ජනතාව බහුතරයක් වාසය කරන ප්‍රදේශ වල ඇති දමිළ මාධ්‍ය පාසල්වල දරුවන් මෙසේ සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය හැදෑරීමට කැමැත්තක් දක්වන බව ද මන්ත්‍රීවරු පෙන්වා දුන්හ.

වර්තමානය වන විට පාසල් තුළට මත්ද්‍රව්‍ය ඉතා ශීඝ්‍රයෙන් ව්‍යාප්ත වෙමින් පවතින බැවින් එය වැළැක්වීම සඳහා කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතු බවට මන්ත්‍රීවරයන් විසින් අදහස් දැක් වූ අතර, සභාපතිවරයා සඳහන් කළේ දැනටමත් ඒ පිළිබඳ ක්‍රියාමාර්ග ගෙන ඇති බවයි.

විශ්ව විද්‍යාලවල සමහර පාඨමාලාවන් ඉංග්‍රීසි භාෂාවෙන් පමණක් ඉගැන්වීම පිළිබඳ මෙහි දී සාකච්ඡා වූ අතර විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති මහාචාර්ය සම්පත් අමරතුංග මහතා පැවසුවේ වර්තමානය වන විට ශාස්ත්‍රපීඨවල පවා අධ්‍යයන කටයුතු ඉංග්‍රීසි භාෂාවෙන් සිදු කරන බවයි. පාර්ලිමේන්තු මන්ත්‍රී වාසුදේව නානායක්කාර මහතා අදහස් දක්වමින් කියා සිටියේ සිංහල සහ ඉංග්‍රීසි යන භාෂා ද්විත්වයෙන්ම ඉගැන්වීම් කළ හැකි අචාර්යවරු අවශ්‍ය වන බවයි.

කොළඹ විශාකා විද්‍යාලයට විදුහල්පතිනියක් පත් කිරීමේ දි සිදුවී ඇති අක්‍රමිකතාවක් පිළිබඳව ලැබුණු පමිණිල්ලක් සම්බන්ධව අවධානය යොමු කරන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු මධුර විතානගේ මහතා විසින් කරන ලද ඉල්ලීම මෙහි දී දීර්ඝ වශයෙන් සාකච්ඡා කෙරිනි.එහිදී විදුහල්පති බඳවා ගැනීමේ පටිපාටිය, එහි පසුගිය කාලය තුළ සිදු කරන ලද වෙනස්කම් පිළිබඳව මෙහි දී නිලධාරීහු කරුණු දක්වා සිටියහ.

එමෙන්ම සියනෑ අධාපන පීඨයට අයත් ඉඩම් කොටසක් බප/ගම්/විද්‍යාලෝක මහා විද්‍යාලයේ ක්‍රීඩා කටයුතු සඳහා ලබා දෙන ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මහතා විසින් කරන ලද ඉල්ලීමද මෙහිදී සලකා බැලිණි.

## ලබාගත් ණය සදහා බැංකු පොලී අනුපාත ඉහළ දැමීම නිසා පීඩාවට පත්වූවන්ට සහන සැලසීමට බැංකුවලට උපදෙස් ලබා දී තිබෙනවා - මහබැංකු අධිපතිවරයා පාර්ලිමේන්තුවේ දී පවසයි

- පවතින මූල්‍ය ප්‍රතිපත්ති අනුව ලබන වසරේ අග වන විට උද්ධමනය 4 - 5% ට අඩුවෙන් පවත්වා ගැනීමට හැකිවේවි...
- බැංකු මගින් ඩොලර් මාරු කිරීමේදී කිසිදු අපහසුතාවක් ඇතිවීමට හේතුවක් නැහැ..



පසුගිය කාලය තුළ විචල්‍ය පොලී අනුපාත යටතේ ලබා ගත් ණය සදහා අය කරන පොලී අනුපාත ඉහළ දැමීම නිසා අපහසුතාවට පත් වූ ණයගැනුම්කරුවන්ට බැංකුව සමග සාකච්ඡා කර සහනයක් ලබා ගත හැකි බව මහ බැංකු අධිපති ආචාර්ය නන්දලාල් වීරසිංහ මහතා ඊයේ පාර්ලිමේන්තුවේදී පැවසීය.

මුදල් රාජ්‍ය අමාත්‍යවරුන් වන රංජිත් සියඹලාපිටිය සහ ශෙහාන් සේමසිංහ යන මහත්වරුන්ගේ ප්‍රධානත්වයෙන් මේ මස 16 වැනිදා පාර්ලිමේන්තුවේ දී පැවති මුදල් , ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති කටයුතු පිළිබද අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී මේ පිළිබදව මන්ත්‍රීවරු විමසා සිටි අවස්ථාවේ දී මහබැංකු අධිපතිවරයා මේ බව පැවසීය.

මෙලෙස පොලී අනුපාතිකය වැඩිවීම නිසා ඇතැම් ණයහිමියන්ගේ මුළු වැටුපම ණය වාරික සඳහා ගෙවීමට සිදුව ඇති බව මන්ත්‍රීවරු පෙන්වා දුන්හ. මෙහිදී මහබැංකු අධිපතිවරයා පැවසුවේ

ගනුදෙනුකරුවන්ට බැංකුව සමග සාකච්ඡා කොට යම් සහන කාලයක් සඳහා අදාළ පොලිය පමණක් ගෙවීමට හැකි බවයි. ඒ පිළිබඳව බැංකුවලට උපදෙස් මේ වන විට ලබා දී ඇති බවත් මහබැංකු අධිපතිවරයා වැඩිදුරටත් පැවසී ය.

එසේම මීට මාස දෙකකට පෙර 70%ක අගයක පැවති සාමාන්‍ය උද්ධමනය මේ වන විට 66% දක්වා අඩුවී ඇති බවත් 95% ක පැවති ආහාර උද්ධමනය 85% දක්වා අඩු වී ඇති බවත් මහබැංකු අධිපතිවරයා පැවසී ය. ඒ අනුව පවතින මූල්‍ය ප්‍රතිපත්ති සමග මෙම අගය ලබන වසර අගවන විට 4 - 5% අගයකට පත්වනු ඇතැයි අපේක්ෂා කරන බව ද ඒ මහතා පැවසීය. එසේම ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ කොන්දේසියකට අනුව මහබැංකුව ස්වාධීන ආයතනයක් බවට පත් කිරීම සඳහා නව පනතක් මේ වන විට කෙටුම්පත් කර අවශ්‍ය කටයුතු සිදුකරන බව ද මහබැංකු අධිපතිවරයා වැඩිදුරටත් පැවසී ය..

එසේම බැංකු මගින් ඩොලර් රුපියල්වලට මාරු කිරීමේ දී සිදුවන අපහසුතා පිළිබඳවද කාරක සභාවේ දී අවධානය යොමුවිය. මේ පිළිබඳව අමාත්‍ය රංජිත් සියඹලාපිටිය මහතා මහබැංකු අධිපතිවරයාගෙන් විමසා සිටි අතර එසේ ප්‍රමාදයන් වීමට හේතුවන කිසිදු උපදෙසක් මහබැංකුව ලබා දී නොමැති බවත් මහබැංකු අධිපතිවරයා මෙහිදී පැවසීය. මේ අනුව ඒ පිළිබඳව සොයා බලා අවශ්‍ය උපදෙස් බැංකුවලට ලබා දෙන ලෙස අමාත්‍යවරයා රාජ්‍ය නිලධාරීන්ට උපදෙස් ලබා දුන්නේ ය.

රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ වාර්තාවකට අනුව ආයතන 126 කින් 22 ක් අවුරුදු 5කට වැඩි ප්‍රමාණයක් වාර්ෂික වාර්තා ඉදිරිපත් කර නොමැති බව ද ඇතැම් වාර්ෂික වාර්තා ලබා දීම වසර 7 ක් පමණ ප්‍රමාද කර ඇති ආයතන පවතින බව ද රාජ්‍ය අමාත්‍ය ෂෙහාන් සේමසිංහ මහතා මෙහි දී පැවසීය. මේ අනුව ඉදිරියේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කටයුතු කරන බැවින් ද නියමිත කාලය තුළ වාර්ෂික වාර්තා භාරදීම පිළිබඳ ආයතන ප්‍රධානීන්ට උපදෙස් දුන් බව රාජ්‍ය අමාත්‍යවරයා පැවසීය.









# යෝජිත දූෂණ විරෝධී පනත් කෙටුම්පතින් පාර්ලිමේන්තුවට වගකියන අල්ලස් හා දූෂණ පිළිබඳ නව ස්වාධීන කොමිෂන් සභාවක්

## ▪ අල්ලස් වංචා සම්බන්ධයෙන් සිදුකරන විමර්ශනවල දී වැරදිකරුවන් බවට පත්වන පුද්ගලයන්ට එරෙහිව දැඩි දඬුවම්



පාර්ලිමේන්තුවට වගකියන අල්ලස් හා දූෂණ පිළිබඳ ස්වාධීන විමර්ශන කොමිෂන් සභාවක් පිහිටුවීම ඇතුළු පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීමට නියමිත යෝජිත දූෂණ විරෝධී පනත් කෙටුම්පත පිළිබඳව අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ දී පසුගියදා අවධානය යොමු විය.

අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍ය ගරු (ආචාර්ය) විජයදාස රාජපක්ෂ මහතාගේ ප්‍රධානත්වයෙන් මේ මස 21 වැනිදා පාර්ලිමේන්තුවේදී එම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව රැස්වූ අවස්ථාවේ දී මේ සම්බන්ධයෙන් සාකච්ඡා කෙරිණි.

අල්ලස්, දූෂණ සහ වංචා වැළැක්වීමට විධිමත් ආයතනික ව්‍යුහයක් නිර්මාණය කර අවශ්‍ය බලතල ලබාදීමට අපොහොසත් වීම නිසා රටේ පවතින සියලුම අල්ලස් හා දූෂණ චෝදනා පාර්ලිමේන්තුව නියෝජනය කරන මන්ත්‍රීවරයන්ට එල්ල වෙමින් පවතින බව අමාත්‍යවරයා සඳහන් කළේ ය.

මෙහි දී යෝජිත දූෂණ විරෝධී පනත් කෙටුම්පත පිළිබඳව ජනාධිපති නීතීඥ සරත් ජයමාන්න මහතා කමිටුව දැනුවත් කළේය. යෝජිත අල්ලස් හෝ දූෂණ විමර්ශන කොමිෂන් සභාව පාර්ලිමේන්තුවට වගකියනු ඇති බවත් කොමිෂන් සභාව සිය ප්‍රගති වාර්තාව මාස තුනකට වරක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවත් ඔහු මෙහි දී පවසා සිටියේ ය.

කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් ලෙස නීති, චෝහාරික විගණන, ගිණුම්කරණය, ඉංජිනේරු, ජාත්‍යන්තර සබඳතා සහ රාජ්‍ය තාන්ත්‍රික සේවය, රාජ්‍ය පරිපාලනය යන ක්ෂේත්‍රවල වසර 20 කට වැඩි පළපුරුද්ද සහිත පුද්ගලයන් පත් කිරීමට ද පනත් කෙටුම්පතේ යෝජනා කර ඇත. කොමසාරිස්වරුන් පත් කරනු ලබන්නේ ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය ඇතිව ජනාධිපතිවරයා විසිනි. ඊට අමතරව මෙම කොමිෂන් සභාව සඳහා මුදල් වෙන් කිරීම පාර්ලිමේන්තුව හරහා සෘජුව සිදු කළ යුතු බවද නීතීඥ ජයමාන්න සඳහන් කළේය.

එසේම වත්කම් බැරකම් ප්‍රකාශ ලබාගැනීමට සහ ඊට අදාළ කරුණු සම්බන්ධයෙන් කටයුතු කිරීමට වෙනම අධ්‍යක්ෂ මණ්ඩලයක් පිහිටුවීමට ද කෙටුම්පත යෝජනා කර ඇත. පනත් කෙටුම්පතට අනුව රාජ්‍ය අංශයේ විධායක නිලධාරීන් හැර දූෂණය සහ අල්ලස වැඩි වශයෙන් සිදුවන ක්ෂේත්‍රවල පුද්ගලයන්ගේ වත්කම් බැරකම් ප්‍රකාශ ලබා ගැනීම සම්බන්ධයෙන් අදාළ අමාත්‍යවරයාට රෙගුලාසි සෑදීමේ හැකියාවද පවතින බව සඳහන් විය. රජයේ වැදගත් දෙපාර්තමේන්තු මෙම කාර්යාලය සමඟ අන්තර්ජාලය හරහා සම්බන්ධ වී ඇති බැවින් වත්කම් බැරකම් පිළිබඳ විමසීම් පහසුවෙන් සිදු කළ හැකි බව ද ජයමාන්න මහතා පැවසීය.

රාජ්‍ය අංශයේ දූෂණ වංචා පමණක් නොව පෞද්ගලික අංශය, ක්‍රීඩා ක්ෂේත්‍රය ආදී අංශවල අල්ලස් හා දූෂණ වැළැක්වීමේ ප්‍රතිපාදන ද ඊට ඇතුළත් බව මෙහිදී සාකච්ඡා විය. අල්ලස් වංචා සම්බන්ධයෙන් සිදුකරන විමර්ශනවලදී වැරදිකරුවන් බවට පත්වන පුද්ගලයන්ට එරෙහිව දැඩි දඬුවම් ලබාදීමේ අවශ්‍යතාව ද කාරක සභාවේදී අවධාරණය කෙරිණි.

යෝජිත පනත් කෙටුම්පතට අදාළව වඩාත් ප්‍රජාතන්ත්‍රවාදී ලෙස සාකච්ඡා කොට සුදුසු සංශෝධන සිදුකිරීමට අපේක්ෂා කරන බව ද අමාත්‍යවරයා මෙහි දී පැවසීය.

පාර්ලිමේන්තුවේ දී ඉදිරියේ දී සම්මත කර ගැනීමට නියමිත “බදු පදනම මත ලබා දී ඇති පරිශ්‍රයන්හි සන්තකය නැවත අත්පත්කර ගැනීමේ (විශේෂ විධිවිධාන)” පනත් කෙටුම්පත පිළිබඳව ද අමාත්‍යවරයා කමිටුව දැනුවත් කළේය. සාමාන්‍ය කුලී සහ නෙරපීමේ නඩු කටයුතුවල දී ඇතිවන නීතියේ ප්‍රමාදයයන් මැඩපවත්වමින් ඉතා කෙටි කාලයක් තුළ දී බදු දීමනාකරුට සහන ප්‍රදානය කිරීම මෙම පනත් කෙටුම්පතේ අරමුණ බව අමාත්‍යවරයා පෙන්වා දුන්නේ ය.

මෙම පනත් කෙටුම්පත මගින් කඩිනම් සහ කාර්යක්ෂම ක්‍රියාදාමයක් හඳුන්වා දී ඇති අතර නොතාරිස්වරයෙකු ඉදිරියේ විධිමත් පරිදි ලියා අත්සන් කළ බදු ගිවිසුමක් මත බද්දට ලබා දී ඇති පරිශ්‍රවල බදු කාල සීමාවන් ඉක්මවා දිගු කලක් රැදී සිටින බදු ගැනුම්කරුවන් නෙරපීමට ද මෙමගින් විධිවිධාන සලසා ඇත.

එමෙන්ම 2022 අංක 25 දරන සාපරාධී කාරණාවල දී අන්‍යෝන්‍ය සහයෝගීතාව දැක්වීමේ පනත යටතේ අධිකරණ අමාත්‍යවරයා විසින් පනවන ලද 2022 ඔක්තෝබර් 12 දිනැති අංක 2301/33 දරන අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද නියමය සලකා බලා අනුමත කිරීම ද මෙහි දී සිදුවිය.












# ප්‍රමාද වී ඇති  විශ්‍රාමික පාරිතෝෂිකය ලබා දීමට කටයුතු කරනවා

**- අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා-**

විශ්‍රාම පාරිතෝෂිකය ගෙවීමේ දී පසුගිය කාලයේ වූ ප්‍රමාදය නිවැරදි කිරීමට වැඩපිළිවෙළක් ආරම්භ කර ඇති බව, අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා පැවසී ය. මේ සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ද  ඉදිරිපත් කළ බවත් ඒ අනුව භාණ්ඩාගාර අනුමතිය ලබා ගෙන කොටස් දෙකක් වශයෙන් මෙම ගෙවීම් සිදුකිරීම සඳහා කටයුතු සලසන බවත් අග්‍රාමාත්‍යවරයා පැවසීය.

අග්‍රාමාත්‍ය සහ  රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතාගේ සභාපතීත්වයෙන් මේ මස 08 පාර්ලිමේන්තුවේ දී පැවති එම අමාත්‍යාංශයීය උපදේශක කාරක සභා රැස්වීමේ දී මේ බව අනාවරණ කළේ, විශ්‍රාමික පාරිතෝෂික දීමනා ප්‍රමාද වීම පිළිබඳ මන්ත්‍රීවරු විමසා සිටි අවස්ථාවේ දී ය.

මෙරට පවතින ආර්ථික අර්බුදය මත භාණ්ඩාගාරය මගින් මුදල් නිදහස් කිරීමේ ප්‍රමාදය හේතුවෙන් විශ්‍රාමික පාරිතෝෂිකය අපේක්ෂාවෙන් විශාල පිරිසක් පොරොත්තු ලේඛනයේ සිටින බව විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා මෙහිදී පැවසී ය. මේ වන විට 2022 ජනවාරි දක්වා සියලු ගෙවීම් සිදු කර ඇති බව ද  ඒ මහතා  මෙහි දී සඳහන් කළේය. එසේම 2022 ජනවාරි සිට ඉතිරි කාලය දක්වා ගෙවීම් සඳහා අවශ්‍ය මුදල් නිදහස් කිරීමට භාණ්ඩාගාරය මේවන විට එකඟතාව පළ කර ඇති  බවත් ඒ අනුව එම මුදල් ලබා දීමට අපේක්ෂා කරන බවත් ඒ මහතා පැවසී ය.

එසේම විශ්‍රාම ගැන්වීමේ වයස අවු 60 දක්වා අඩුකිරීම නිසා මෙම වසරේ දෙසැම්බර් 31 වැනිදායින් පසු නව අයදුම්පත් ප්‍රමාණයක් ලැබෙනු ඇතැයි අපේක්ෂා කරන බවද විශ්‍රාම වැටුප් අධ්‍යක්ෂ ජනරාල්වරයා සඳහන් කළේ ය. ඔවුන් සියලු දෙනාට ම මූලික විශ්‍රාම වැටුප කඩිනමින් ලබා දීමට විශේෂ වැඩපිළිවෙළක් සකස් කර ඇති බවද ඒ මහතා පැවසී ය.





පළාත් පාලන ආයතනවල දීර්ඝ කාලයක් සේවය කළ සේවකයන්ගේ ගැටලු විසඳීම පිළිබඳවද මෙහිදී අවධානය යොමුවිය. මේ අනුව ඒ සඳහා ඉදිරි ක්‍රියාමාර්ග නිර්දේශ කිරීමට විශේෂ කමිටුවක් පත් කිරීමට පියවර ගන්නා බවද පළාත් සභා හා පළාත් පාලන රාජ්‍ය අමාත්‍ය ජානක වක්කුඹුර මහතා පවසා සිටියේය.

එසේම අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා මෙහිදී අමාත්‍යාංශ බලධාරීන්ට උපදෙස් ලබා දුන්නේ, දැනට ප්‍රමාද වී ඇති රාජ්‍ය ආයතන වාර්ෂික වාර්තා හැකි ඉක්මනින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු බවයි. තව ද අනෙකුත් රාජ්‍ය ආයතනවලට ද මේ බව දන්වා යවා ඒවායේ ප්‍රමාද වී ඇති වාර්තා පාර්ලිමේන්තුවට ගෙන්වා ගැනීමට මෙම සාකච්ඡාවේ දී තීරණය කෙරිණි.

නගර සභා ගණනාවක් මහනගර සභා බවට පත් කරන අග්‍රාමාත්‍යවරයාගේ වැඩපිළිවෙළ ගැන ද මෙහි දී සාකච්ඡාවට ලක්විය. අග්‍රාමාත්‍යවරයා රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයා ලෙස උතුරු පළාතේ ද එම වැඩපිළිවෙළ සිදුකිරීම පිළිබදව

පාර්ලිමේන්තු මන්ත්‍රී චාල්ස් නිර්මලනාදන් මහතා ප්‍රසාදය පළ කරමින් ඉල්ලා සිටියේ ය. මන්නාරම ද මහ නගර සභාවක් බවට පත් කිරීමේ දී මන්නාරම ප්‍රාදේශිය සභාව අහෝසි නොවන ලෙස එම කටයුතු සිදු කරන ලෙසය.

නුවරඑළිය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය ලේකම් කොට්ඨාස වැඩිකිරීම සඳහා අවශ්‍ය පියවර ගන්නා ලෙස පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේෂන් මහතා මෙහි දී ඉල්ලීමක් කළේ ය. එහි දී මේ සම්බන්ධව සාකච්ඡා කර කරුණු කාරක සභාවට වාර්තා කරන බවට අමාත්‍යාංශ නිලධාරීහු එකඟතාව පළ කළහ.




## නව ස්ථාවර කාරක සභා ද්විත්වයක් ස්ථාපිත කිරීමට අදාළ ස්ථාවර නියෝග පිළිබද කාරක සභාවේ වාර්තාව පාර්ලිමේන්තුවට

ජනාධිපතිතුමාගේ යෝජනාවක් පරිදි ස්ථාපිත කිරීමට නියමිත කාරක සභා ද්විත්වයකට අදාළ ස්ථාවර නියෝග පිළිබද කාරක සභාවේ වාර්තාව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා විසින් මේ මස 18 වැනිදා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.

මේ අනුව බැංකුකරණය සහ මූල්‍ය සේවා පිළිබඳ කාරක සභාව සහ ආර්ථික ස්ථායීකරණය පිළිබඳ කාරක සභාවට අදාළ සංයුතිය, බලතල සහ කාර්යයන් මෙම වාර්තාවේ අන්තර්ගත වේ.

මේ මස 16 වැනිදා ස්ථාවර නියෝග පිළිබඳ කාරක සභාව රැස් වූ අතර එහි දී මෙම කාරක සභා ද්විත්වය ස්ථාපිත කිරීම සහ ඊට අදාළ ස්ථාවර නියෝග පිළිවෙළින් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 122 සහ 123 වශයෙන් සංශෝධිත ස්ථාවර නියෝගවලට ඇතුළත් කිරීම අනුමත කරන ලදී.



**ලැබී ඇති අමාත්‍ය මණ්ඩලය අනුමතිය අනුව, සමෘද්ධි නිලධාරීන්ට හා ක්ෂේත්‍ර නිලධාරීන්ට ඡන්දය ඉල්ලීමේ අවස්ථාව ලබාදීම සඳහා වහාම නීතිමය තත්ත්වය සකසන්න ...**

**අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යවරයාගෙන් නිලධාරීන්ට උපදෙස්...**

**- රාජ්‍ය සේවයේ අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදුකරන පරීක්ෂණවල පවතින අධික ප්‍රමාදය මගහරවා ගැනීමට කඩිනම් ක්‍රමවේදයක්...**

**- දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සඳහා තම තටයුතු සිදු කර ගෙනයාම සඳහා කාර්යාල පහසුකම්...**

**- ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ස්ථාන මාරුවීම් සඳහා ජාතික ප්‍රතිපත්තියක් සැකසීමට යෝජනා...**



සමෘද්ධි නිලධාරීන්ට හා ක්ෂේත්‍ර නිලධාරීන්ට ඡන්දය ඉල්ලීමේ අවස්ථාව ලබා දීම සඳහා අමාත්‍ය මණ්ඩලය අනුමත කර ඇති අතර වහාම ඊට අවශ්‍ය නීතිමය තත්ත්වය සකස් කරන ලෙස, පළාත් පාලන අමාත්‍යංශයේ අතිරේක ලේකම් සහ එහි නීති නිලධාරියා වෙත, අග්‍රාමාත්‍ය සහ රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා උපදෙස් ලබා දුන්නේ ය.

ඒ,රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාව පාර්ලිමේන්තුවේ දී මේ මස 24 වැනිදා අග්‍රාමාත්‍යවරයාගේ සභාපතිත්වයෙන් රැස් වූ අවස්ථාවේ දී ය.

ක්ෂේත්‍ර නිලධාරීන් හට සිය කොට්ඨාසය තුළ ම ඡන්දය ඉල්ලීමේ හැකියාව ලබා දීම සඳහා ලැබී ඇති කැබිනට් අනුමතිය අනුව,සංශෝධනයක් සිදු කිරීම සඳහා ඔක්තෝබර් 19 වැනිදා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇති බව, අමාත්‍යංශ නිලධාරීහු මෙහි දී ප්‍රකාශ කළේ ය.

ශ්‍රී ලංකා සංවර්ධන පරිපාලන ආයතනයේ කාර්යභාරය පිළිබඳ මෙහි දී විමසා බැලුනු අතර, ආයතන ප්‍රතිව්‍යුහගත කිරීමේ වැඩසටහනට මෙම ආයතනය ද ඇතුළත්ව ඇති බැවින් මන්ත්‍රීවරයන් ආයතනය වෙත ගෙන්වා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලෙස, අග්‍රාමාත්‍යවරයා එහි අධ්‍යක්ෂ ජනරාල්වරිය වෙත උපදෙස් ලබා දුන්නේ ය.

රැස්වීමට සහභාගී වූ මන්ත්‍රීවරුන් ඉල්ලා සිටියේ ප්‍රාදේශීය ලේකම්වරුන් සඳහා ස්ථාන මාරුවීමේ ජාතික ප්‍රතිපත්තියක් සකස් කරන ලෙසයි. ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ස්ථාන මාරුවීම් සම්බන්ධයෙන් නිශ්චිත ක්‍රමවේදයක් නොමැති බවත් ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ ඉල්ලීම් මත මාරුවීම් ලබාදීම සිදුකරන බවත්, පැවසූ අමාත්‍යාංශ ලේකම්වරයා,මේ වනවිට ප්‍රාදේශීය ලේකම්වරයෙක් හට එක් ස්ථානයක සේවය කළ හැක්කේ අවුරුදු 06 ක් බවත් එහි උපරිමය අවුරුදු 12 ක් ලෙසක් රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් නිර්දේශයක් ලබාගෙන ඒ පිළිබඳ ප්‍රාදේශීය ලේකම්වරුන් දැනුවත් කිරීම් සිදුකර ඇති බවත් කියා සිටියේ ය.

සමහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2021 සඳහා ලබාදී තිබූ ප්‍රතිපාදන යොදවා කිසිදු



සංවර්ධන කටයුත්තක් සිදු කොට නොතිබීම පිළිබඳවද මෙහි දී අවධානය යොමු විය. එහි දී සභාපතිවරයා අමාත්‍යාංශ ලේකම්වරයා වෙත උපදෙස් ලබා දුන්නේ ඒ පිළිබඳ සොයා බලා නිසි පියවර ගන්නා ලෙසයි. අල්ලස් ගැනීම්, වංචා සහ දූෂණ වලට සම්බන්ධ ප්‍රාදේශීය ලෙකම්වරු සම්බන්ධයෙන් සිදු කෙරෙන පරීක්ෂණ මන්දගාමී බවද මන්ත්‍රීවරු පෙන්වා දුන්නේය.

අක්‍රමිකතා සිදුකරන ග්‍රාමනිලධාරින් සම්බන්ධයෙන් විනය ක්‍රියාමාර්ග ගන්නා ලෙසද මෙහි දී මන්ත්‍රීවරු ඉල්ලා සිටි අතර සාක්ෂි සහිතව කරුණු ඉදිරිපත් කොට තිබිය දී පවා ක්‍රියාමාර්ග ගැනීම ප්‍රමාදවීම පිළිබඳව ද මෙහි දී අවධානය යොමු විය. මෙහි දී නිලධාරීන් සඳහන් කළේ ලැබෙන සෑම පැමිණිල්ලක් සම්බන්ධයෙන්ම ක්‍රියාමාර්ග ගන්නා බවයි. එහි දී ප්‍රාථමික හා ද්විතීක මට්ටමේ නිලධාරීන්ගේ පැමිණිලි ප්‍රාදේශීය ලේකම්වරුන් වෙතත්, තෘතීයික මට්ටමේ නිලධාරීන්ගේ පැමිණිලි දිස්ත්‍රික් ලේකම්වරුන් වෙතත් යොමු කොට ඇති අතර විධායක මට්ටමේ නිලධාරීන්ගේ පැමිණිලි සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය සෘජුව මැදිහත් වන බවයි. රාජ්‍ය සේවයේ අක්‍රමිකතා සම්බන්ධයෙන් සිදුකරන පරීක්ෂණවල පවතින අධික ප්‍රමාදය මගහරවා ගැනීමට වහා කටයුතු කළ යුතු බව, අග්‍රාමාත්‍යවරයා අවධාරණය කළේ ය.

දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරුන් සඳහා තම තටයුතු සිදු කර ගෙන යාම සඳහා කාර්යාල පහසුකම් කඩිනමින් ලබා දිය යුතු බව සභාපතිවරයා ස්වදේශ කටයුතු අතිරේක ලේකම් වෙත අවධාරණය කළ අතර දිස්ත්‍රික් කාර්යාලවල ඒ සඳහා පහසුකම් නොමැති අවස්ථාවල දි පළාත් අණ්ඩුකරවරු සමඟ සාකච්ඡා කොට ඒ සඳහා පහසුකම් ලබා ගන්නා ලෙස ද වැඩි දුරටත් උපදෙස් දුන්නේ ය.

මීට පෙර යෝජනා කරන ලද මෙතෙක් අමාත්‍ය මණ්ඩල අනුමතිය නොලද, නගර සභා මහ නගර සභා බවට අසස් කිරීම සඳහා කරුණු යළි අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු අප්‍රමාද ව ඉටු කරන ලෙස ද අතිලේක ලේකම් (පාලාත් පාලන හා පළාත් සභා ) වෙත සභාපති අග්‍රාමාත්‍ය දිනේෂ් ගුණවර්ධන මහතා උපදෙස් දුන්නේ ය.

පාළාත් පාලන මැතිවරණ ක්‍රමය යළි වෙනස් කරන ලෙස මන්ත්‍රීවරුන් විසින් ඉල්ලීම් සිදු කරන ලද අතර එම ඉල්ලීම් සීමා නිර්ණය කමිටුව වෙත ඉදිරිපත් කරන ලෙස සභාපතිවරයා පැවසිය. මෙරට මැතිවරණ ක්‍රමය වෙනස් කිරීමට අග්‍රාමාත්‍යවරයා දිගු කාලයක් ගත් උත්සහය වෙනුවෙන් පාර්ලිමේන්තු මන්ත්‍රී මනෝ ගනේශන් මහතා විශේෂ ස්තුතිය පිරිනැමී ය.

කොළඹ නගරයේ සනිපාරක්ෂක හා මලාපවාහන ව්‍යාපෘති වෙනුවෙන් වසර 15 ක් පමණ කාලයක් තුළ විශාල මුදලක් වැය කර ඇති නමුත් මෙතෙක් එම වැඩසටහන සාර්ථකව අවසන් කර නොමැති වීම පිළිබඳ කණස්සල්ල පළ කළ අග්‍රාමාත්‍යවරයා, ඉදිරි වසර තුළ අවසන් කළ හැකි වෙන් වෙන් වු යෝජනා සකස් කර අමාත්‍ය මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කරන ලෙසද නිලධාරීන්ට උපදෙස් දුන්නේ ය.





# ජල සම්පාදනයේ දී පිරිවැයට සරිලන ලෙස ජල ගාස්තුව සංශෝධනය කරන්න

## - ජල සම්පාදන මණ්ඩලයෙන් උපදේශක කාරක සභාවට යෝජනාවක්...





ජල සම්පාදනයේ දී පිරිවැයට සරිලන ආකාරයෙන් ජල ගාස්තුව සංශෝධනය කිරීමේ අවශ්‍යතාව ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නිලධාරීන් විසින් ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවට යෝජනා කරන ලදී.

මෙහිදී ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයේ නිලධාරීන් පෙන්වා දුන්නේ ජලය ලීටරයක් තවමත් සත 2 පමණ මුදලකට පාරිභෝගිකයන්ට ලබාදෙන බවත් මෑතක දී එය සත 5ක් දක්වා වැඩි කළ ද ජල ලීටරයක් සැකසීම සඳහා යන වියදම සත 12 ක් 14 පමණ වන  බවත් ය. මේ නිසා එම වියදමට සරිලන ආකාරයෙන් ජල ගාස්තු සංශෝධනය කළ යුතු බව එම නිලධාරීහු පෙන්වා දුන්හ.

මේ පිළිබඳ සාකච්ඡා වූයේ ජල සම්පාදන කටයුතු පිළිබඳ අමාත්‍යාංශයීය  උපදේශක කාරක සභාව අමාත්‍ය ගරු කෙහෙලිය රඹුක්වැල්ල මහතාගේ සභාපතිත්වයෙන් මේ මස 17 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස් වූ අවස්ථාවේ දී ය.

මෙහි දී වැඩිදුරටත් එම නිලධාරීන් සඳහන් කළේ මෑතක දී ජල ගාස්තු වැඩි කළ ද ජල සම්පාදනය සඳහා යන වියදම පෙර තිබූ ප්‍රමාණයට වඩා 50% කින් පමණ වැඩි වී ඇති බවයි. එම නිසා වර්තමාන ජල ගාස්තුව වියදමට සාපේක්ෂව ප්‍රමාණවත් නොවන බව නිලධාරීහු පෙන්වා දුන්හ.

විශේෂයෙන්ම වර්තමානයේ පවතින ආර්ථික අර්බුදය හමුවේ ජල ව්‍යාපෘති සඳහා මුදල් වෙන් කිරීමට අපහසු තත්ත්වය මත මෙසේ ජල ගාස්තු සංශෝධනය කිරීම මගින් යම් ආකාරයකින් මුදල් ඉතිරියක් සිදු වන්නේ නම් එම මුදල ජල



ව්‍යාපෘති වෙනුවෙන් වෙන් කළ හැකි බව ද මෙහි දී නිලධාරීහු සඳහන් කළහ.

මෙහිදී සමෘද්ධි ලාභීන්, වැඩිහිටි ප්‍රජාව ඇතුළු අඩු ආදායම්ලාභීන් හැර අනෙකුත් පාර්ශ්ව සඳහා ජල ගාස්තු සංශෝධනය කිරීම පිළිබඳ අවධානය යොමු කරන බව අමාත්‍යවරයා සඳහන් කළේය.

තව ද පානීය ජල බෝතල්වලින් රජයට බදු මුදලක් අයකිරීම පිළිබඳව සහ දිවයිනේ විවිධ ප්‍රදේශවල පවතින ජල ව්‍යාපෘතිවල වර්තමාන ප්‍රගතිය පිළිබඳව ද මෙහි දී සාකච්ඡා විය.

# ජාතික සභාවේ යෝජනා සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳව අධීක්ෂණයට විශේෂිත ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීම පිළිබඳ අවධානය ...

ජාතික සභාව විසින් ගෙනෙනු ලබන යෝජනා සහ නිර්දේශ ක්‍රියාත්මක කිරීම පිළිබඳ අධීක්ෂණය සඳහා විශේෂිත ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවීම පිළිබඳව 'ජාතික සභාවේ' දී දීර්ඝ ලෙස සාකච්ඡා විය.

මෙහි දී ජාතික සභාව ගෙනෙන යෝජනා සහ නිර්දේශ ලේඛනයකට පමණක් සීමා නොවිය යුතු බවත් ඒවා ක්‍රියාත්මක විය යුතු බවත් ඒ පිළිබඳ පසු විපරමක් සිදු විය යුතු බවත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් වන ගරු නාමල් රාජපක්ෂ මහතා සහ ගරු පාඨලී චම්පික රණවක මහතා පෙන්වා දුන්නේය. එබැවින් ඒ සඳහා ව්‍යවස්ථාපිත ආයතනයක් ආරම්භ කිරීම හෝ දැනට පවතින ආයතනයක් ප්‍රතිව්‍යුහගතකිරීම සිදුකළ යුතු බව ඔවුහු පෙන්වා දුන්හ.

අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා ද මෙම යෝජනාව සම්බන්ධයෙන් එකඟතාවය දැක්වූ අතර ඉක්මනින් මෙම ආයතනය පිහිටුවීමේ හැකියාව පිළිබඳ සොයා බලන බව සඳහන් කළේ ය.

මේ පිළිබඳ සාකච්ඡා කෙරුණේ ජාතික සභාව කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතාගේ සභාපතීත්වයෙන් සහ අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතාගේ සහභාගීත්වයෙන් මේ මස 24 වැනිදා පාර්ලිමේන්තුවේ දී රැස්වූ අවස්ථාවේ දී ය.

මෙහිදී ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීම සඳහා විශ්වවිද්‍යාල උප කුලපතිවරුන්ගේ සහ විශ්ව විද්‍යාල ආචාර්යවරුන්ගේ සහයෝගය ලබා ගැනීම සම්බන්ධයෙන් සකස් කරන ලද යෝජනා පිළිබඳව සහ ඔවුන් සමඟ කරන ලද සාකච්ඡාවේ ප්‍රගතිය පිළිබඳව 'කෙටි, මධ්‍යම සහ දීර්ඝ කාලීන ජාතික ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ දී ප්‍රමුඛතා හඳුනා ගැනීම සඳහා වන අනු කමිටුවේ' සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී නාමල් රාජපක්ෂ මහතා විසින් ජාතික සභාවට ඉදිරිපත් කරන ලදි.

ආර්ථික ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍ය කාලීන වැඩසටහන් හඳුනා ගැනීම සඳහා වන අනු කමිටුවේ' සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී පාඨලී චම්පික රණවක මහතා විසින් බැංකු ක්ෂේත්‍රය, ප්‍රවාහන ක්ෂේත්‍රය, සංචාරක ක්ෂේත්‍රය සහ ව්‍යාපාර ක්ෂේත්‍රය පිළිබඳ සිදු කරන ලද







සාකච්ඡාවල ප්‍රගතිය ජාතික සභාව වෙත ඉදිරිපත් කරන ලදි.

අග්‍රාමාත්‍ය ගරු දිනේෂ් ගුණවර්ධන මහතා මෙහිදී විශේෂයෙන් ම සඳහන් කළේ, ඉන්ධන සහ බලශක්ති අර්බුදය ඉදිරි වසරවලදී මුහුණදීමට සිදුවන දැවැන්ත අභියෝගයක් බවයි. එබැවින් ඒ පිළිබඳ අවධානය යොමු කරමින් ඊට මුහුණ දීමට අවශ්‍ය ප්‍රතිපත්තියක් සකස් කළ යුතු බව හෙතෙම පෙන්වා දුන්නේය. ඒ සඳහා ජාතික සභාව අවධානය යොමු කළ යුතු බව ද අගමැතිවරයා වැඩිදුරටත් සඳහන් කළේ ය.

එසේම පළාත් සභා සහ මධ්‍යම ආණ්ඩුව එක්ව කටයුතු කිරීමේ ප්‍රතිපත්තියක් සකස් කිරීමේ වැදගත්කම පිළිබඳ කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මෙහි දී අවධාරණය කළේ ය. ඉදිරියේ දී පළාත් සභා මැතිවරණයකින් අනතුරුව මෙම අවශ්‍යතාව වැඩි වශයෙන් දැනෙනු ඇති බව ද ඒ මහතා පෙන්වා දුන්නේ ය.

# #LKaskMP




ශ්‍රී ලංකාවේ විදේශ ප්‍රතිපත්තිය සහ ඉදිරි ගමන්මග පිළිබඳ විදේශ කටයුතු අමාත්‍ය ජනාධිපති නීතිඥ ගරු අලි සබ්රි මහතා සහභාගී වූ සජීවී ට්විටර් සාකච්ඡාව මේ මස 09 වැනිදා පාර්ලිමේන්තුවේ නිල ට්විටර් ගිණුම (@ParliamentLK) ඔස්සේ පැවැත්වුණි.



ආර්ථික ස්ථායීකරණයට අදාළ කෙටි සහ මධ්‍යම කාලීන වැඩසටහන් හඳුනා ගැනීම පිළිබඳ ජාතික සභා අනු කාරක සභාවේ සභාපති පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු පාඨලී චම්පික රණවක මහතා, සහභාගී වූ සජීවී ට්විටර් සාකච්ඡාව මේ මස 26 වැනිදා පාර්ලිමේන්තුවේ නිල ට්විටර් ගිණුම (@ParliamentLK) ඔස්සේ පැවැත්වුණි.

# පාර්ලිමේන්තුව සැකෙවින්...

## නොවැම්බර් 2022



මෙවර සටහන - **එච්. ඊ. ජනකාන්ත සිල්වා** - අධ්‍යක්ෂ (ව්‍යවස්ථාදායක සේවා)/ අධ්‍යක්ෂ (සන්නිවේදන) (වැඩබලන)

**නොවැම්බර්**

### 2022.11.08

■ පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 111 ප්‍රකාරව ආංශික අධීක්ෂණ කාරක සභා 17 ක් ස්ථාපිත කිරීම යථා පරිදි පාර්ලිමේන්තුව විසින් සම්මත කරනු ලැබීම.

■ "විසි එක්වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය" ප්‍රකාරව ස්වාධීන කොමිෂන් සභා පිහිටුවීම පිළිබඳ අධිකරණ, බන්ධනාගාර කටයුතු හා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ අමාත්‍යවරයා විසින් ප්‍රකාශ කරනු ලැබීම.

■ "පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් (සංශෝධන)" නමැති පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු නීතිඥ ප්‍රේම්නාත් සී. දොලවත්ත මහතා විසින් ඉදිරිපත් කරනු ලැබීම.

### 2022.11.10

■ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව අභියෝගයට ලක්කරන ලද "එකතු කළ අගය මත බදු (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබීම.

■ "සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය", "පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන)", "උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)", "අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)" සහ "අන්තරායක සත්ත්ව (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් පහ දෙවැනි වර සහ තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් සංශෝධන රහිතව යථා පරිදි සම්මත කරනු ලැබීම.

■ "අධිකරණ සංවිධාන (සංශෝධන)", "සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)", "විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)" සහ "ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් පහ දෙවැනි වර සහ තුන්වැනි වර කියවා පාර්ලිමේන්තුව විසින් සංශෝධිතාකාරයෙන් යථා පරිදි සම්මත කරනු ලැබීම.

### 2022.11.14

■ 2023 මුදල් වර්ෂයට අදාළ "විසර්ජන" නමැති පනත් කෙටුම්පත දෙවැනි වර කියැවීමේ විවාදය මුදල් අමාත්‍යවරයා විසින් අයවැය කතාව ඉදිරිපත් කරමින් ආරම්භ කරනු ලැබීම.

## 2022.11.15

■ 2022 මුදල් වර්ෂයට අදාළ 2022 අංක 30 දරන "විසර්ජන" නමැති පනත සංශෝධනය කිරීම සඳහා "විසර්ජන (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගන්වා පළමුවැනි වර කියවනු ලැබීම.

## 2022.11.17

■ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 ව්‍යවස්ථාව ප්‍රකාරව අභියෝගයට ලක්කරන ලද "දේශීය ආදායම් (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත පිළිබඳ ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය කථානායකවරයා විසින් පාර්ලිමේන්තුවට නිවේදනය කරනු ලැබීම.

■ "සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය", "අධිකරණ සංවිධාන (සංශෝධන)", "පළාත්බද මහාධිකරණ (විශේෂ විධිවිධාන) (සංශෝධන)", "සිවිල් නඩු විධාන සංග්‍රහය (සංශෝධන)", "උඩරට විවාහ හා දික්කසාද (සංශෝධන)", "අපරාධ නඩු විධාන සංග්‍රහය (සංශෝධන)", "ළමයින් සහ තරුණ තැනැත්තන් (සංශෝධන)" සහ "අන්තරායක සත්ත්ව (සංශෝධන)" නමැති පනත් කෙටුම්පත් අට පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා විසින් සහතිකය සටහන් කරනු ලැබීම.

## 2022.11.19

■ "බද්දට දී ඇති පරිශ්‍රවල සන්තකය ආපසු ලබාගැනීමේ" නමැති පනත් කෙටුම්පත පාර්ලිමේන්තුවට පිළිගන්වා පළමුවැනි වර කියවනු ලැබීම.

## 2022.11.123

■ "විෂ වර්ග, අබිං සහ අන්තරායදායක ඖෂධ වර්ග (සංශෝධන)" සහ  නමැති පනත් කෙටුම්පත් පහ පිළිබඳව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 ව්‍යවස්ථාව ප්‍රකාරව කථානායකවරයා විසින් සහතිකය සටහන් කරනු ලැබීම.

■ පාර්ලිමේන්තුවේ දැනට බලාත්මකව පවතින ස්ථාවර නියෝග දෙවැනිවරට සංශෝධනය කිරීමේ යෝජනා පාර්ලිමේන්තුව විසින් යථා පරිදි සම්මත කරනු ලැබීම.

**-මෙහි ඉතිරි කොටස මීළඟ කලාපයෙන් බලාපොරොත්තු වන්න-**



පාර්ලිමේන්තු ඡායා ගැලරිය









චීනයේ විදෙස් රටවල් අතර මිත්‍රත්ව සංගමයේ සභාපති ලින් සොන්ජ්ටියන් මහතා මේ මස කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු විය. ශ්‍රී ලංකාවේ චීන තානාපති ඡී ෂෙංන්හොන්ග් මහතාද පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතාද මෙම අවස්ථාවට එක්වූහ.










දකුණු කොරියාවේ විදේශ කටයුතු අමාත්‍යවරයාගේ විශේෂ නියෝජිත හැන් ඩොන්ග්මන් (Han Dongman) මහතා ප්‍රමුඛ නියෝජිත පිරිසක් මේ මස 15 වැනිදා පාර්ලිමේන්තුවේදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවූහ.








ඇමරිකා එක්සත් ජනපදයේ සෙනෙට් විදේශ සබඳතා කමිටුවේ (Senate Foreign Relations Committee) කාර්ය මණ්ඩල සාමාජිකයින් පිරිසක් මේ මස 10 වැනිදා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

මෙම පිරිස පාර්ලිමේන්තුවේ නිරීක්ෂණ චාරිකාවකද නිරත වූ අතර පසුව කථානායක ගරු මහින්ද යාපා මහතා සමග සහ පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා සමග සුහද පිළිසඳරක යෙදුණි.




ඒක්සත් අරාබි එමීර් රාජ්‍යයේ තානාපති එච්. ඊ. බලීඩ් නසර් අල් - අමේරි මහතා මේ මස 08 වැනිදා පාර්ලිමේන්තුවේදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමු විය.





ශ්‍රී ලංකාවේ නව ප්‍රංශ තානාපති ජෝ ෆස්වා මහතා මේ මස 28 වැනිදා පාර්ලිමේන්තුවේදී කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා හමුවිය.

පාර්ලිමේන්තුවේ මහලේකම් ධම්මික දසනායක මහතා ද මෙම අවස්ථාවට එක්ව සිටියේය. මෙහිදී අයවැය කාලසීමාව සහ පාර්ලිමේන්තු වැඩකටයුතු පිළිබඳ මෙන්ම දෙරට අතර පවත්නා පාර්ලිමේන්තු ක්‍රමවේදයන් සහ දේශපාලන ව්‍යුහය ආදිය පිළිබඳවද දෙපාර්ශවය සුහද සාකච්ඡාවක නිරත විය.





ශ්‍රී ලංකාවේ දකුණු අප්‍රිකාවේ මහ කොමසාරිස් එඩ්වින් ෂාක් මහතා කථානායක ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා මේ මස 28 වැනිදා පාර්ලිමේන්තුවේදී හමුවිය. මෙම අවස්ථාවට පාර්ලිමේන්තු මහලේකම් ධම්මික දසනායක මහතා ද එක්ව සිටියේය.

# පාර්ලිමේන්තු විත්ති


**පුවත් හසුන I 29 වැනි කාණ්ඩය I නොවැම්බර් 2022**

**ISSN 2806 – 5425**



**සන්නිවේදන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ.**

**දුරකථනය : +94 11 2777100        ෆැක්ස් : +94 11 2777227**

**www.parliament.lk**

**Parliament of Sri Lanka**        **@ParliamentLK**

**@slparliament**        **Parliament of Sri Lanka**